# 2026 පළමුවන කාර්තුව සඳහා වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

ආයතනයේ නම - උතුරු මැද පළාත් සභාව

වර්ෂය හා කාර්තුව - 2026 – I

දිනය - 2026.03.13

රැස්වීම ආරම්භ කරන ලද වේලාව - පෙ.ව.9.00

**කමිටුව**

ජේ.එම්.ආර්.පී.ජයසිංහ මහතා, උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් - සභාපති

යූ.එස්. අරුණරවි මහතා, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්), පළාත් භාණ්ඩාගාරය - සාමාජික

ඩී.ඩබ්.එස්.රංජිත් මහතා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - සාමාජික

කේ.එම්.එල්. ආරියරත්න මිය, ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - නිරීක්ෂක

බී.වී.කේ.බී. බෙනරගම මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උ.මැ.ප - කැඳවුම්කරු

**සහභාගී වූ වෙනත් නිලධාරීන්,**

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | නන්දන ගලබොඩ මයා | ආණ්ඩුකාරවර ලේකම් | පළාත් ආණ්ඩුකාර කාර්යාලය, උ.මැ.ප |
| 02 | එම්.සුභාගිනී මිය | ලේකම් | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, උ.මැ.ප |
| 03 | එම්.ශ්‍රීස්කන්ධකුමාර් මයා | ලේකම් | පළාත් සමූපකාර අමාත්‍යාංශය, උ.මැ.ප |
| 04 | එස්.ගුණපාලන් මයා | ලේකම් | පළාත් පාලන අමාත්‍යාංශය, උ.මැ.ප |
| 05 | පී.එස්.විමලවීර මිය | ලේකම් | පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාව, උ.මැ.ප |

| | | | |
|---|---|---|---|
| 06 | ජී. කේ.එස්. චන්ද්‍රලතා මිය | නි.ප්‍ර.ලේ. (පාලන) | ප්‍රධාන ලේකම් කාර්යාලය, උ.මැ.ප. |
| 07 | ආර්.එම්.කේ.ආර්.බී.රත්නායක මයා | නි.ප්‍ර.ලේ. (පුහුණු) | පළාත් කළ.සං. හා පුහුණු ඒකකය උ.මැ.ප |
| 08 | එන්.ජී.දයාරත්න මයා | නි.ප්‍ර.ලේ. (සැළසුම්) | පළාත් සැළසුම් දෙපාර්තමේන්තුව, උ.මැ.ප. |
| 09 | ඩී.එම්.යූ.එස්.බී.දිසානායක මයා | නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) වැ.බ. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 10 | ආර්.සී.ඩී.ප්‍රනාන්දු මිය | සභාපති | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, උ.මැ.ප |
| 11 | එන්.කුමාරරත්න මයා | සභාපති | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය |
| 12 | අනෝමජී රාජපක්ෂ මිය | සභාපති | පුස්තකාල සේවා මණ්ඩලය, උ.මැ.ප |
| 13 | ජී.ගෝනපීනුවල මයා | සභාපති | පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, උ.මැ.ප |
| 14 | තිලිණි පතිරගේ මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, උ.මැ.ප. |
| 15 | යූ.එස්.පුෂ්පකාන්ති මිය | අධ්‍යක්ෂ(අයවැය) | පළාත් භාණ්ඩාගාරය, උ.මැ.ප |
| 16 | බී.ඒ.නෙරන්ජන් ධනපාල මයා | ප්‍රධාන ඉංජිනේරු (තාක්ෂණ) | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 17 | විශ්‍රාමික කර්නල් ඒ.ටී.සරත් ආරියරත්න මයා | කළමණාකාර අධ්‍යක්ෂ | මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය, උ.මැ.ප |
| 18 | වෛද්‍ය චම්පා අලුත්වීර මිය | අධ්‍යක්ෂ | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 19 | ජී.සී.මුතුවත්ත මිය | අධ්‍යක්ෂ | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 20 | ආර්.ඩී.එම්.ආර්.ඩබ්.රණවාරණ මිය | අධ්‍යක්ෂ | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 21 | එච්.එම්.ජේ.හේරත් මයා | අධ්‍යක්ෂ | පළාත් වාර්මාර්ග දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 22 | එස්.එම්.ඩබ්.සමරකෝන් මයා | අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 23 | එච්.එම්.පී.ඉන්දික මයා | අධ්‍යක්ෂ | පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 24 | දුර්ගා ජයසිංහ මිය | අධ්‍යක්ෂ | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 25 | ආර්.එච්.ඒකනායක මයා | අධ්‍යක්ෂ | පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 26 | ගයනී රත්නායක මිය | අධ්‍යක්ෂ | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, උ.මැ.ප |

| | | | |
|---|---|---|---|
| 27 | එල්.එච්.වී.ඉරෝෂිණී මිය | අධ්‍යක්ෂ(වැ.බ.) | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 28 | අනුරාධ දිසානායක මයා | කොමසාරිස් | පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 29 | වෛද්‍ය පී.එම්.ගොඩගේ මිය | කොමසාරිස් | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 30 | ඩබ්.එම්.ඩී.එන්.අමරතුංග මිය | කොමසාරිස් | පළාත් පරිවාස දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 31 | ජී.ඒ.කිත්සිරි මයා | කොමසාරිස් | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 32 | එන්.එච්.ආර්.නිශාන්ත මයා | නාගරික කොමසාරිස් | මහ නගර සභාව, අනුරාධපුර |
| 33 | එම්.ජේ.ඉලංගසිංහ මයා | ස.ලේකම්(මුදල්) | පළාත් කෘෂිකර්ම අමාත්‍යංශය, උ.මැ.ප |
| 34 | කේ.එම්.එල්.ජේ.චන්ද්‍රසිරි මයා | සාමාන්‍යාධිකාරි | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, උ.මැ.ප |
| 35 | වීරවිජය ගුණසේකර මයා | සාමාන්‍යාධිකාරි | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, උ.මැ.ප |
| 36 | වෛද්‍ය චන්දන කැදන්ගමුව මයා | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ-අනුරාධපුර | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 37 | වෛද්‍ය එස්.රාජ්කුමාර් මයා | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ-පො/නරුව | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 38 | ආර්.එම්.එම්.රත්නායක මයා | ප්‍රධාන ගණකාධිකාරී | පළාත් ප්‍රධාන අමාත්‍යංශය, උ.මැ.ප |
| 39 | ඩී.එම්.ඒ.එස්.දහම්පත් මිය | -එම- | පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය, උ.මැ.ප |
| 40 | ඒ.යූ.ජී.ටී.නන්දසිරි මයා | -එම- | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 41 | බී.ඒ.ඒ.විජේරත්න මයා | -එම- | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව |
| 42 | ලක්මිණී අමරසූරිය මිය | ප්‍රධාන ගණකාධිකාරී (අධ්‍යාපන) | පළාත් ප්‍රධාන අමාත්‍යංශය, උ.මැ.ප |
| 43 | ජේ.කේ.එම්.යූ.කේ. ජයසිංහ මයා | අතිරේක ප.අධ්‍යාපන අධ්‍යක්ෂ (මුදල්) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 44 | ආර්.ඒ.ඒ.ඩී.රණසිංහ මයා | විගණන අධිකාරී | ජාතික විගණන කාර්යාලය |
| 45 | ජී.කේ.ඩී.ප්‍රසංගිකා මිය | -එම- | -එම- |
| 46 | එම්.කමල්සේකර මයා | -එම- | -එම- |
| 47 | එස්.එස්.එන්.දිසානායක මයා | ගණකාධිකාරි | ප්‍රධාන ලේකම් කාර්යාලය උ.මැ.ප |

| | | | |
|---|---|---|---|
| 48 | අයි.එම්.ඒ.ටී.දිසානායක මයා | -එම- | පළාත් සමූපකාර අමාත්‍යාංශය |
| 49 | කේ.ජී.පී.නිල්මිණී මිය | -එම- | පළාත් පාලන අමාත්‍යාංශය, උ.මැ.ප |
| 50 | ජී.එම්.එස්.කේ.කරුණාරත්න මයා | -එම- | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 51 | එම්.සී.කුමාර මයා | -එම- | ප්‍රා.සෞ.සේ.අ.කාර්යාලය, පොළොන්නරුව |
| 52 | ආර්.එම්.ඩී.එම්.බණ්ඩාර මයා | -එම- | ප්‍රා.සෞ.සේ.අ.කාර්යාලය, අ/පුර |
| 53 | ඩී.ඒ.කේ.උඩහගේ මයා | -එම- | පළාත් පාලන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 54 | පී.යූ.එස්.රත්නසිරි මිය | -එම- | පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 55 | කේ.පී.ඒ.සෞම්‍යකාන්ති මිය | -එම- | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 56 | එච්.ජී.එන්.සම්පත් මයා | -එම- | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 57 | ටී.එච්.එන්.එම්.ජයමහ මිය | නාගරික ගණකාධිකාරී | අනුරාධපුර මහ නගර සභාව |
| 58 | ජී.ඩබ්.ඒ.එම්.ගලප්පත්ති මයා | ඉංජිනේරු | පළාත් පාලන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 59 | බී.එම්.ආර්.ටී.ඒකනායක මයා | සහකාර ලේකම්(මුදල්) | පළාත් භාණ්ඩාගාරය, උ.මැ.ප |
| 60 | වෛද්‍ය බී.අයි.බුලත්සිංහල මයා | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 61 | වෛද්‍ය චරින්ද්‍ර ද සිල්වා මයා | සැලසුම් වෛද්‍ය නිළධාරි | ප්‍රා.සෞ.සේ.අ.කාර්යාලය, අ/පුර |
| 62 | වෛද්‍ය ඩී.එල්.ඒ.දිසානායක මයා | සැලසුම් වෛද්‍ය නිළධාරි | ප්‍රා.සෞ.සේ.අ.කාර්යාලය, පොළොන්නරුව |
| 63 | ඩී.එම්.ජේ.දිසානායක මයා | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, උමැප |
| 64 | බී.එච්.එම්.ටී.ඩබ්.බුලත්සිංහල මයා | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, උමැප |
| 65 | ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මයා | අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) | පළාත් සැළසුම් දෙපාර්තමේන්තුව, උ.මැ.ප. |
| 66 | ඒ.එස්.එම්.අස්මිල් මයා | නි.අධ්‍යක්ෂ | පළාත් සමූපකාර අමාත්‍යාංශය, උ.මැ.ප |
| 67 | ආර්.එම්.කේ.සී.විජේරත්න මිය | සහකාර ලේකම්(පාලන) | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, උ.මැ.ප |
| 68 | ඩබ්.ඒ.සී.කේ.වික්‍රමසිංහ මයා | නි.අධ්‍යක්ෂ | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |

| | | | |
|---|---|---|---|
| 69 | යූ.එච්.චන්ද්‍රසේකර මයා | නි.අ.අධ්‍යක්ෂ(පාලන) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 70 | ඩී.එම්.එස්.වී.දිසානායක මිය | නීති නිලධාරී | ප්‍රධාන ලේකම් කාර්යාලය, උ.මැ.ප |
| 71 | ඩී.එම්.බී.ටී.දිසානායක මිය | නීති නිලධාරී | ප්‍රධාන ලේකම් කාර්යාලය, උ.මැ.ප |
| 72 | ඩී.ආර්.කේ.තිලකරත්න මයා | ගණකාධිකාරී | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, උ.මැ.ප |
| 73 | එස්.ඩබ්.ටී.සී සුනෙත් මයා | ගණකාධිකාරී | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, උ.මැ.ප |
| 74 | යූ.එල්.එම්.රහුමාන් මයා | සහකාර අධ්‍යක්ෂ | මූල් ළමාවිය සංවර්ධන අධිකාරිය, උ.මැ.ප |
| 75 | ජේ.ඒ.ලලිතා රණසිංහ මිය | පරිපාලන නිලධාරී | පළාත් පාලන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 76 | ජේ.ඒ.බී.මල්ලිකා මිය | අභ්‍යන්තර විගණන හා විමර්ශන නිලධාරී | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 77 | ජේ.එම්.ඩබ්.බඹරදෙණිය මිය | අභ්‍යන්තර විගණන හා විමර්ශන නිලධාරී | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 78 | එල්.ටී.ගමගේ මයා | අභ්‍යන්තර විගණන හා විමර්ශන නිලධාරී | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 79 | ඒ.දිසානායක මයා | අභ්‍යන්තර විගණන හා විමර්ශන නිලධාරී | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උ.මැ.ප |
| 80 | ජී.ආර්.එම්.එම්.ගජනායක මයා | අභ්‍යන්තර විගණන නිලධාරී | -එම- |
| 81 | එස්.එස්.කේ.එම්.සෙනවිරත්න මිය | -එම- | -එම- |
| 82 | කේ.ඒ.කුරුනේරු මිය | -එම- | -එම- |
| 83 | ආර්.පී.ජේ.එස්.කුමාර මහතා | -එම- | -එම- |
| 84 | ඩී.එම්.කේ.ජී.එස්.එම්.සමරකෝන් මිය | -එම- | -එම- |
| 85 | ඩී.එම්.කේ.ජී.එස්.එස්.සමරකෝන් මිය | -එම- | -එම- |
| 86 | එම්.අයි.ඒ.මනෝරි මිය | -එම- | -එම- |
| 87 | එච්.එම්.එල්.පී.අබේසිංහ මිය | -එම- | -එම- |
| 88 | ඩී.ජී.ඩී.එන්.තුෂාරි මිය | ප්‍රධාන කළ.සේවා නිලධාරිණී | පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| 89 | පී.කේ.හේරත් මිය | කළ. සේ. නිලධාරී | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උ.මැ.ප |

01. පසුගිය රැස්වීම් වාර්තාව සංශෝධනයන් රහිතව සහා සම්මත විය.

**02. පසුගිය රැස්වීම්වලදී සාකච්ඡා කල අවසන් තීරණයක් ලබා නොදුන් කරුණුවල ප්‍රගතිය**

| අනු අංකය | කාරණය | පෙර කමිටු රැස්වීම්වලදී ලබා දෙන ලද නිර්දේශ | ප්‍රගතිය | ප්‍රවර්තන කමිටු රැස්වීමේදී ලබාදුන් නිර්දේශ/තීරණය හා ක්‍රියාත්මක කර අවසන් කල යුතු දිනය | වගකිව යුතු නිලධාරියා | සාකච්ඡා කල වාර ගණන |
|---|---|---|---|---|---|---|
| | **පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | | | | | |
| 01 | එන්ජිම අතුරුදහන් වූ අංක 19-6923 දරණ වාහනය<br>එන්ජිම අස්ථානගතවීමට අදාලව ඊට වගකිවයුතු අය හඳුනාගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යංශ ලේකම්ගේ අංක NCP/CM/ED/03/විනය/පොදු ගොනුව හා 2025.05.14 දිනැති ලිපිය මගින් පහත පරීක්ෂණ කමිටුව පත් කර ඇත.<br>අනුරාධ දිසානායක මහතා, සමූ. කොමසාරිස්, උ.මැ.ප. - සභාපති | කමිටු සභාපති අනුරාධ දිසානායක මහතා විසින් එම වාර්තාව සතියක් ඇතුලත ලබා දෙන බව විගණන කමිටුව හමුවේ ප්‍රකාශ කරන ලදී.<br><br>වාර්තාව ප්‍රමාද නොකර ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | පරීක්ෂණ කමිටු වාර්තාව මෙතෙක් ලබා දී නැත. මේ පිළිබඳ පරීක්ෂණ කමිටු සභාපති විසින් ප්‍රකාශ කරන ලද්දේ පරීක්ෂණ කටයුතු අවසන් බවත්, අවසාන වාර්තාව මසක් තුල ලබා දීමට කටයුතු කරන බවත්ය. | ඊ ලග විගණන කමිටුව දිනය වන විට කමිටු වාර්තාව ලබාගෙන නිර්දේශ අනුව කටයුතු කර අවසන් කර තිබිය යුතු බව දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යංශ ලේකම්/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 12 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | අනෝමා ගුණසේකර මෙය, පරිපාලන නිලධාරී, තඹුත්තේගම මූලික රෝහල - සාමාජික<br>ආර්.අයි.බී.කේ.එස්.එස්.රත්නමලල මයා, සංවර්ධන නිලධාරී, පළාත් අධ්‍යාපන දෙපා. - සාමාජික | | | | | |
| 02 | අ/මුකිරියාව මුස්ලිම් මහා විද්‍යාලයේ සිදුව ඇති අක්‍රමිකතා හා අවභාවිතයන්. | මූලික විමර්ශන වාර්තාව 2025.06.05 දින භාර දී ඇත.වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.<br>මු.රෙ. 104(ප.මු.රී 54) පරීක්ෂණය සිදු කර නොමැති බැවින් වහාම සිදු කල යුතු බවට උපදෙස් ලබා දෙන ලදී. | මූලික විමර්ශන කමිටු වාර්තාව ලබා දී ඇත. විදුහල්පතිවරයාට එරෙහි චෝදනාපත්‍ර කෙටුම්පත විනය බලධාරියා වන ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇත.<br>මෙහි පුස්තකාල පොත් යම් ප්‍රමාණයක් අස්ථානගතවීමක් සිදුවී ඇති බවත්, ඊට අදාල අලාභයේ වටිනාකම වශයෙන් NC 100-එම්/1009757 දරණ ලදුපතින් රු.52827.24 ක මුදලක් 2026.01.14 දින කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගලෙන්බිදුණුවැව වෙත ගෙවා ඇත.<br>විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 යටතේ 2022 වර්ෂයේ විශ්‍රාම ගන්වා ඇති ගුරුවරිය සඳහා චෝදනා පත්‍ර නිකුත් කිරීමට නිර්දේශ කර නොමැත. | දැනට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 යටතේ විශ්‍රාම ගන්වා ඇති ගුරුවරිය 2.14 යටතේ විශ්‍රාම ගැන්වීමට නොපමාව කටයුතු කල යුතු බවත්, ඒ සඳහා කටයුතු කිරීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් අප්‍රසාදය පල කිරීමත් සිදුකල කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් සතියක් ඇතුලත මෙය අවසන් කල යුතු බව දන්වන ලදී. එසේම ගුරුභවතුන් | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | විශ්‍රාම ගැන්වීමේදී අප්‍රමාදව කටයුතු කිරීමේ අවශ්‍යතාවය දැඩි ලෙස අවධාරණය කරන ලදී. | | |
| 03 | **පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**<br><br>i. කළුවිලසේන මහා විද්‍යාලයේ හිටපු විදුහල්පතිගේ වැඩ තහනම් කිරීමට එරෙහිව ඔහු විසින් ගොනු කරන ලද නඩුවෙහි (WRIT) තීරණය අනුව ඔහු නැවත එම විදුහලේ විදුහල්පති ලෙස පත්කර ඇත. මෙහිදී මූලික විමර්ෂණයක් සිදු කර නොතිබීම හා "විගණන විමසුමක්" "විගණන වාර්තාවක්" ලෙස සඳහන් කර තිබීම යන කරුණු මත අමාත්‍යාංශ ලේකම්වරයා බලය ඉක්මවා කටයුතු කර ඇති බවට එම අධිකරණ තීන්දුවේ වැඩිදුරටත් දන්වා ඇත. මෙම විදුහල්පතිවරයා අදාළ ලිපි ලේඛන භාර නොදීම සහ පරීක්ෂණ සඳහා ඉදිරිපත්වීම පැහැරහැරීමක් සිදු කර ඇති බව හා ගරු අධිකරණය වෙත නිවැරදි | මෙහිදී ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම ඡේදය මෙම කමිටුවට යොමු කරන ලද්දේ නිලධාරීන්ගේ වැරදි හේතුවෙන් මෙම නඩුවෙන් පැරදී ඇති බව නිරීක්ෂණය වන හේතුවෙන් බවය. එසේම මෙම විදුහල්පති විසින් මෙයට පෙර තවත් නඩුවක් ගොණු කර තිබූ බව අනාවරණය වූ බවත්, එයට පදනම්ව ඇත්තේ ඇත්තේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කල යුතු ඔහුගේ සේවා අනුයුක්තය පළාත් අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කර තිබීම වැරදි බව දක්වමින් බවද එහි තීන්දුව ලෙස ඔහු නැවත පෙර සේවා ස්ථානයටම පත් කිරීමට නියෝග කර ඇති බව ද ප්‍රකාශ කරන ලදී. | | මෙම සියළු කරුණු අමාත්‍යාංශ විගණන කමිටුවලදී සාකච්ජා කර තීරණ ගෙන ඇති බැවින් මෙම කමිටුවේදී සාකච්ජා කිරීම අවශ්‍ය නොවන බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | තොරතුරු ඉදිරිපත් කර නොමැති බවට විගණනයට නිරීක්ෂණය වී ඇත. | එසේම තවත් නඩුවක් ඔහු විසින් ගොණු කර ඇත්තේ 2022 ඔක්තෝබර් මස නිකුත් කරන ලද විගණන විමසුමක් පදනම් කරගෙන මෙම විදුහල්පතිගේ වැඩ තහනම් කරන ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන ලේකම් වෙත කරන ලද නිර්දේශය පදනම් කරගෙන පළාත් අධ්‍යාපන ලේකම් විසින් ඔහුගේ වැඩ තහනම් කිරීම වැරදි බව දක්වමින් ලෙස ද ඇය විසින් ප්‍රකාශ කරන ලදී. එහි තීන්දුව ලෙස "විගණන විමසුමක්" "විගණන වාර්තාවක්" ලෙස සඳහන් කර තිබීමත් විදුහල්පති සේවයේ නිලධාරියෙකුගේ වැඩ තහනම් කිරීම ප්‍රධාන ලේකම් විසින් සිදු කල යුතු වුවත් පළාත් අධ්‍යාපන ලේකම් විසින් සිදු කිරීම වැරදි බව දක්වා ඔහු නැවත එම විදුහලේ විදුහල්පති ලෙස පත්කරන ලෙස නියෝග කර ඇති බවය. | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ii. විදේශ උපාධි ප්‍රතිඵල සනාථ කිරීම අදාළ විශ්ව විද්‍යාලය වෙතින් සිදු කර නොතිබීම නිසා සේවය ස්ථිර නොකරන ලද ගුරුවරුන් වෙත දීර්ඝ කාලයක් තිස්සේ වැටුප් ගෙවීම (මෙම කාරණය පිළිබඳව කලාප හා පළාත් මට්ටමෙන් පවත්වනු ලබන විගණන සහ කළමනාකරණ කමිටු වල දීර්ඝ කාලයක් සාකච්ඡා වෙමින් පවතී) උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් ලබා දීමේදී සිදු කළ වරදක් නිසා මෙම තත්වය ඇතිවී ඇති බවට විගණනයට නිරීක්ෂණය වී ඇත. | විදේශ උපාධි සනාථ කර ගැනීමට විදේශ කටයුතු අමාත්‍යාංශය හරයා යොමු කිරීම් කරන බවත්, ඒවා සනාථ වීමට වසර ගණනාවක් ගත වන බවත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br>විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති එම තොරතුරුවල වාර්තාවක් ලබා දෙන ලෙසත්, ඒ පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශ විගණන කමිටුවේදී විමසීම් කල හැකි බවත්, කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. එසේම ප්‍රතිපල සනාථ කර එවන තෙක් නොසිට උපාධි නිකුත් කර ඇති ආයතන සම්බන්ධයෙන් සොයා බලා එවැනි ආයතන පවතී ද යන්න පිළිබද අවධානය යොමු කරන ලෙස ද දන්වන ලදී. | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | iii. ගුරුවරුන් නිවාඩු අනුමත කර නොගෙන විදේශගතවීම හා විදේශගතවීමට නිවාඩු ඉල්ලුම්කර ඇති බවට අදාළ විදුහලේ ලේඛනවල සටහන්වී නොතිබීම සහ විදුහල්පති දැනුවත්වී නොතිබුණු අවස්ථා තිබෙන බවට විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වී ඇත.<br><br>iv. (අ) ඇතැම් කලාප වල අතිරික්තව සිටින සංවර්ධන නිලධාරීන් පුරප්පාඩු තිබෙන ස්ථාන වලට යොමුකිරීමට කටයුතු කර නොතිබෙන බව විගණනයට නිරීක්ෂණයවී ඇත.<br><br>(ආ) කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්යමණ්ඩල ඌණතාවයත් පැවතීම. එම කලාපයේ අවුරුදු 10 ක් ඉක්මවා සේවය කර ඇති නිලධාරීන්ට අනුප්‍රාප්තිකයෙකු නොමැතිවීම නිසා ස්ථාන මාරුවී යාමට | ගුරුභවතුන්ගේ විදේශ නිවාඩු අයදුම්පත් විදුහල්පතිගේ නිර්දේශය මත ඉදිරිපත් කල යුතු වන බැවින් විදුහල්පතිවරුන් දැනුවත්වන බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br><br>පළාත තුල අනුමත සංවර්ධන නිලධාරීන් 492 ක අතිරික්තයක් පවතින බවත්, ඔවුන් පාසැල් වල අධ්‍යයන කාර්යයන්ට සම්බන්ධ කර ඇති බවත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br><br>විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් උතුරු මැද පළාත තුල ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව නොතිබුන බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.නමුත් මේ වන විට එය සකස් කර ඇති | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නොහැකිවී තිබීම. එසේම මෙම කාර්යාලයට ස්ථාන මාරු කරන ලද නිලධාරීන් විවිධ හේතු සඳහන් කරමින් එම ස්ථානමාරු වීම අවලංගු කර ගැනීම නිසා සිටින නිලධාරීන්ට තම ස්ථාන මාරුවීම ලබා ගැනීමට නොහැකි වී තිබෙන බව විගණනයට නිරීක්ෂණය වී ඇත.<br>(ඇ) අවුරුදු 05 කට වඩා වැඩි කාලයක් එකම පාසලක සේවය කරන ලද ගුරුභවතුන් සහ විදුහල්පතිවරුන් ස්ථාන මාරු කිරීම සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම | බවත්, 2026 ජනවාරි සිට ඒ අනුව විදුහල්පතිවරුන් ස්ථාන මාරු කිරීමට කටයුතු සැළසුම් කර ඇති බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | | | | |
| | (ඈ) ගුරුභවතුන්, විදුහල්පතිවරයා දැනුවත් නොකර නිවාඩු ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් නොකර නිවාඩු ලබා ගන්නා අවස්ථාවන් තිබෙන බවට විගණනයේදී නිරීක්ෂණයවී ඇති බැවින් ඉගැන්වීම් කටයුතු සඳහා බාධාවන පරිදි ගුරුවරුන් නිවාඩු ලබා ගැනීම් පාලනය කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවට නිරීක්ෂණය වේ. | ගුරුභවතුන් 50 ට වැඩියෙන් සිටින ප්‍රවාහන පහසුකම් තිබෙන පාසල් සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකිරීමට ජාතික මට්ටමින් තීරණයක් ගත යුතු බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br>ගුරුවරුන් නිවාඩු ලබා ගැනීම් පාලනය කිරීම පාසැල් මට්ටමින් | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | v. ගුරුභවතුන් 50 ට වැඩියෙන් සිටින ප්‍රවාහන පහසුකම් තිබෙන පාසල්වල ගුරුභවතුන් 7.30 ට පාසල වෙත පැමිණ නොතිබුණු අවස්ථා විගණනයට නිරීක්ෂණය වී ඇත. එම මගහැරුණු අවස්ථා සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව විගණනයට නිරීක්ෂණය විය.<br>vi. විශේෂ අධ්‍යාපන පත්වීම් ලබා වෙනත් විෂයයන් උගන්වනු ලබන ගුරුවරුන් සඳහා වැටුප් වර්ධක ගෙවීම සහ දීමනා ගෙවීම සිදු කිරීම. ඒ අනුව සෑම කලාපයකම 37/2020 චක්‍රලේඛ අනුගත නොවන බව දෙපාර්තමේන්තු විගණනය හා කළමනාකරණ කමිටුවේදී අනාවරණය විය.<br>vii. 2022 ජනවාරි මස ආරම්භ කරන ලද මූලික විමර්ශන කටයුතු 25 ක් පැවතියද ඒවා නිරවුල් කර නොතිබුණි. | සිදුවිය යුතු බැවින් විදුහල්පතිවරුන් දැනුවත් කර ඇති බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලද අතර තවදුරටත් දැනුවත් කිරීම් කරන බව ද ප්‍රකාශ කරන ලදී.<br>විශේෂ අධ්‍යාපන විෂයයට බඳවා ගත් වෙනත් විෂයයන් උගන්වනු ලබන ගුරුවරුන් හඳුනා ගෙන ඔවුන් අනුයුක්ත කල යුතු පාසැල් ද නම් කර අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බවත් අනුමැතිය ලද පසුව ඔවුන් ස්ථානගත කිරීමට හැකි බවත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුල පලාතේ වැඩිම සේවක සංඛ්‍යාවක් සිටින බැවින් මූලික විමර්ශන ප්‍රමාණය ද වැඩි නමුත් මාණ්ඩලික නිලධාරී විශාල හිගයක් පවතින බැවින් මූලික විමර්ශන ඉටු කිරීමේ ප්‍රමාදයක් ඇති බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී. | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය** | | | | | |
| 04 | පෙර පාසල් කාර්යාල පරිශ්‍රය හා සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලක්ෂ 75 ක අත්තිකාරම් මුදලක් 2017 වර්ෂයේදී ලබා දී ඇති අතර, ඉදිකිරීමේ දී නගර සභාව විසින් අනුමත කර ඇති සීමාව ඉක්මවා ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති බැවින්, තහනම් නියෝගයක් ලබා දී ඇත. | ඉදිකිරීම නතර කිරීම කොන්ත්‍රාත්කරුගේ ගැටළුවක් නොවන නමුත් ලබා දෙන ලද රු. ලක්ෂ 75 ක අත්තිකාරම් මුදලට සරිලන ඉදිකිරීම් සිදුවී නොමැති බැවින් හා ඉදිරියේදී හෝ එය උපයෝජනය නොවීමේ අවදානමක් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාංශය මගින් මාස 03 ක් ඇතුලත පරීක්ෂණයක් සිදු කිරීමට තීරණය විය. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NCP/CM/ED 03/විනය/2024/2 හා 2025.03.26 දිනැති ලිපිය මගින් මූලික විමර්ශනය සඳහා පහත කමිටුව පත් කර 2025.04.30 දිනට පෙර වාර්තාව ලබා දෙන ලෙස දන්වා ඇත.<br>සභාපති - බී.එම්.ආර්.ටී.ඒකනායක මයා, ස.ලේ.(මුදල්), වාරිමාර්ග අමාත්‍යාංශය<br>සාමාජික - ඩී.එම්.ජේ.දිසානායක මයා, අධ්‍යක්ෂ(සැළසුම්), පළාත් සෞඛ්‍ය අමාත්‍යං.<br><br>කමිටු සභාපතිගේ රාජකාරි බහුලත්වය හේතුවෙන් නව කමිටු සභාපති ලෙස පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ජයලත් මහතා පත් කර ඇති බවත් , වාර්තාව සති දෙකක් තුල ලබා දෙන බවත් කමිටු සාමාජික දිසානායක මහතා විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඉදිකිරීම සම්බන්ධයෙන් දැනට විරෝධයක් නොමැති බවත්, ඉදිකිරීම් සඳහා මෙම වසරේ ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැළසුම්) විසින් දන්වන ලදී. | කමිටු වාර්තාව සති දෙකක් තුල ලබා ගෙන ඉදිකිරීම් ආරම්භ කරන ලෙස දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් | 16 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | | | | | |
| 05 | • මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි තවදුරටත් අයවීමට ඇති රුපියල් මිලියන 97.2 සම්බන්ධව CECB ආයතනය සමඟ කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්තුව විධිමත්ව අවසන් කිරීම.<br>• තීරකවරයකු පත්කර ඇත. CIDA ආයතනයට රු.325,000.00 මුදලක් ගෙවා ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | CECB ආයතනය වෙත කොන්ත්‍රාත් ලබා දීම අනුමත කර ඇත්තේ 2009.01.21 දින පවත්වා ඇති කැබිනට් මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 09/0077/356/004 මගින් බැවින් මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය වෙත දැනුම් දීම සුදුසු බව ද කමිටුව විසින් තීරණය කරන ලදී. CECB ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා ද කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ වන බැවින් මෙම කරුණට අදාලව එම දෙපාර්තමේන්තුවෙන් පැමිණි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ මැදිහත්වීම අපේක්ෂා කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) විසින් ප්‍රකාශ කල අතර, අවශ්‍ය සම්පූර්ණ තොරතුරුවල සාරාංශයක් තමාට ලබා දෙන ලෙස අතිරේක | • මු.රෙ. 104(ප.මු.රී.54) පරීක්ෂණය සඳහා පහත කමිටුව පත් කර වාර්තාව 2025.04.28 හෝ එදිනට පෙර ලබා දෙන ලෙස දන්වා ඇත.<br>සභාපති- දූර්ගා ජයසිංහ මිය, පළාත් සංස්කෘතික අධ්‍යක්ෂ -<br>සාමාජික- R.M.D.M.බංඩාර මයා, ගණකාධිකාරී, ප්‍රා.සෞ.සේ.අ.කාර්යාලය, අ/පුර-<br>සාමාජික- W.M.S.විජේසිංහ මයා, පරිපාලන නිලධාරී, පළාත් කෘෂි.අමාත්‍යාංශය<br>• මු.රෙ. 104(ප.මු.රී.54) කමිටු වාර්තාව ලබා දී ඇත.<br>මු.රෙ. 104(ප.මු.රී.54) කමිටු වාර්තාව අනුව සුරක්ෂණ නොමැතිව අත්තිකාරම් ගෙවීම හේතුවෙන් මෙම අලාභය සඳහා වගකිව යුතු බවට නිර්දේශ කර ඇත්තේ උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වගකිව යුතු බවට දක්වා ඇති නිලධාරීන්ම බවත්, ඊට අදාලව අලාභය ගෙවන ලෙස ඔවුන් වෙත දන්වා ඇතත් මෙතෙක් ගෙවීම් කර නොමැති බැවින් මේ සම්බන්ධයෙන් ද කටයුතු කරන්නේ කෙසේද යන්න ගැටළු සහගත | පෙර විගණන කමිටුවේදී දැනුම් දුන් පරිදි මෙතෙක් තමාට තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් හා මෙම කරුණ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ අකාර්යක්ෂමතාවය පිළිබඳ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් අප්‍රසාදය පල කරමින් සියළුම තොරතුරු සඳහන් කර(ඇමුනුම් සහිතව) නැවත CECB ආයතනය වෙත ලිපියක් යොමු කර එහි පිටපත තමා වෙත ලබා දෙන ලෙස නැවතත් දන්වන ලදී. | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 16 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කරන ලදී. | බව ප්‍රධාන අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී. | එසේම මු.රෙ. 104(ප.මු.රී.54) කමිටු නිර්දේශ සම්බන්ධයෙන් අභියාචනා කිරීමේ ක්‍රමවේදයක් දැනට නොමැති බවත්, මු.රෙ. 104 නිර්දේශ ක්‍රියාත්මක කල යුතු බවත්, එසේ නොකල හොත් ඊලග පියවර ලෙස එම නිර්දේශ ක්‍රියාත්මක නොකල නිලධාරීන්ට වගකීමට සිදුවන බව ද අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. | | |
| 06 | තිරප්පනේ මහානාම විද්‍යාලයේ තෙමහල් පන්ති කාමර ගොඩනැඟිල්ලක් හා දෙමහල් ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ඉදි කිරිමේ ව්‍යාපෘතියෙහි සියයට 30 ක අත්තිකාරම් මුදල් ලබාගැනීම වෙනුවෙන් රු.12,435,596.00 ක අත්තිකාරම් ඇපකරයක් සහ රු.2,072,600.00 ක | කොන්ත්‍රාත්කරුට විරුද්ධව නිතීමය ක්‍රියාමාර්ග සිදු වෙමින් පවතින බව හා අදාල නිලධාරින් සම්බන්ධව ක්‍රියා මාර්ග ගැනීම සඳහා චෝදනා පත්‍ර රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය වෙත ලබා දී ඇති බව | තවදුරටත් අයවිය යුතු රුපියල් මිලියන 02 ක වැට් මුදල ගෙවන ලෙස ආදාල කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත. කොන්ත්‍රාත්කරු දැනට අතුරුදහන් බවත්, මීට අදාල ගොණුව පොලිස් වාණිජ අපරාධ විමර්ශන ඒකකය භාරයට ගෙන ඇති බැවින් ගොණුව ඉල්ලා ඇති බවත්, එය ලද වහාම මු.රෙ.104 පරීක්ෂණය ආරම්භ කරන බවත්, Vat | | ප්‍රධාන අමාත්‍යංශ ලේකම් | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කර තිබුණි. නමුත් මෙම කොන්ත්‍රාත්කරු විසින් කිසිදු හේතු දැක්වීමකින් තොරව කොන්ත්‍රාත්තුවේ වැඩ අතහැර දමා ඇති බව කැකිරාව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත (අත්තිකාරම් හා කාර්යසාධන ඇපකර වලංගු කාලය අවසන්වීමට දින 58 කට පෙර) අංක NCP/DE/KEK/MA02/EDU හා 2018 පෙබරවාරි 01 දිනැති ලිපිය මගින් දන්වා තිබුණද ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් හා අදාල වගකිවයුතු නිලධාරින් යථෝක්ත ඇපකර මුදල් බවට පත්කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයට එකතුව රු. 14,508,196.00 ක අලාභයක් සිදුකර තිබුණි.<br>I. කොන්ත්‍රාත්කාර ආයතනයට විරුද්ධව මේ වන විට කොළඹ මූල්‍ය හා වාණිජ අපරාධ කොට්ඨාශයේ වාණිජ අපරාධ විමර්ශන අංක II මගින් විමර්ශන සිදු කෙරෙමින් පවතී.<br>II. මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති රු.12,435,596.07 ක අත්තිකාරම් මුදල | | මුදල අයකර ගෙන ඇද්ද යන්න පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස් වෙතින් විමසීමට කටයුතු කරන් ඇති බවත් ප්‍රධාන අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. (අංක NCP/CM/FD/12/විගණන කමිටු 2026 හා 2026.03.09 ලිපිය)<br>මෙතෙක් මු.රෙ.104 පරීක්ෂණ කමිටු පත් කර නැත. | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පහත පරිදි වෙනත් බිල්පත් 04 ක් මගින් පියවා ගෙන ඇත.<br>2023.06.01 - 4,546,479.70<br>2024.12.31 - 189,614.36<br>– 356,628.56<br>2023.11. – 7,342,873.62<br>12,435,596.24<br>III. මිලියන 02 ක Vat මුදල් තවදුරටත් අයවීමට ඇත.<br>IV. කොන්ත්‍රාත් ආයතනය වන රජකුමරි කන්ස්ට්‍රක්ෂන් ආයතනය ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CS/PT/FR/02/18 හා 2020.10.16 ලිපියෙන් අසාධු ලේඛන ගත කර ඇත.<br>V. අදාල නිලධාරිණියට විරුද්ධව චෝදනා පත්‍ර සකස් කර රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයට යවා ඇත.<br>VI. මු.රෙ.104(ප.මු.රී.54) පරීක්ෂණය සිදු කර නැත. | | | | | |
| 07 | ළඟම පාසල හොදම පාසල වැඩසටහන යටතේ සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු. 140,596, 776ක් වැය කර අඩක් ඉදි කරන ලද ව්‍යාපෘති 20 ක් වැඩ අවසන් | කමිටු වාර්තා කඩිනමින් ලබා ගන්නා ලෙස දන්වන ලදී.<br>මු.රෙ. 104(ප.මු.රී.54) පරීක්ෂණ නිසි කාලය තුල සිදු නොකර ප්‍රමාදවී | ඉදිකිරීම් 02 ක අත්තිකාරම් අය කරගෙන ඇත. අනෙකුත් කොන්ත්‍රාත් 04 ට අදාලව මු.රෙ. 104(ප.මු.රී.54) පරීක්ෂණ කමිටු පත් කර ඇත. | | ලේකම්, ප්‍රධාන අමාත්‍යංශ | 06 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කර නොමැති වීමෙන් එම ව්‍යාපෘති සඳහා දරන ලද එකතුව රු.. 140,596,776.00 ක වියදම නිෂ්කාර්ය බව නිරීක්ෂණය විය .එකී ඉදිකිරීම් කොන්ත්‍රාත් 06කට අදාළ තවදුරටත් අයවිය යුතු අත්තිකාරම්වල වටිනාකම රු. 36,881, 569.00 ක් විය.<br>**ව්‍යාපෘති20**<br>I. ඉහල බුල්නෑව ම.වි.<br>II. මිහින්තලය ම.වි<br>III. නල්ලච්චිය ම.වි.<br>IV. කලන්කුට්ටිය ම.වි.<br>V. ඇතුමල්පිටිය ප්‍රා.වි.<br>VI. විජයරාජ ම.වි.<br>VII. සුංගාවිල ම.වි.<br>VIII. පලුගස්දමන ම.වි.<br>IX. අඹගස්වැව ම.වි.ද්විතියික විද්‍යාගාරය<br>X. අඹගස්වැව ම.වි.තාක්ෂණික විද්‍යාගාරය<br>XI. ජයන්තිගුරුකුල ප්‍රා.වි.<br>XII. විද්‍යාලෝක ප්‍රා.වි.<br>XIII. කවුඩුල්ල ම.වි.<br>XIV. අත්තනකඩවල ම.වි.<br>XV. යෝධඇල ම.වි. | සිදු කිරීමේදී ඇති නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති බවත්, අලාභය හඳුනාගෙන ඊට වගකිව යුතු අය වෙතින් අයකර ගැනීමට කටයුතු කල යුතු බවත්, එම අයගෙන් අය කර ගත නොහැකි නම් පරීක්ෂණ ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන සිදු වී ඇති අලාභය එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට නිර්දේශ කල යුතු බවත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. මු.රෙ.104 පරීක්ෂණයේ තීන්දුවට එරෙහිව අභියාචනා කල නොහැකි බව ද ඔහු විසින් වැඩිදුරටත් දන්වන ලදී. | 01. **පලුගස්දමන මහ විදුහල ප්‍රාථමික ඉගෙනුම් මධ්‍යස්ථානය ඉදි කිරීම -**<br>සභාපති- බී.ඒ.එන්.ජයලත් මයා, තත්වපාලන ඉංජිනේරු<br>සාමාජික - බී.එම්.ආර්.ටී.ඒකනායක මයා, ස.ලේ.(මුදල්), පළාත් වාරිමාර්ග අමාත්‍යංශය<br>සාමාජික - සී.එස්.කේ. ධර්මසේන මයා පරිපාලන නිලධාරී, පළාත් ක්‍රීඩා දෙපා.<br><br>02 **තන්තිරිමලේ ශ්‍රී විමලඥාන ම.වි.දෙමහල් තාක්ෂණික ගොඩනැගිල්ල ඉදිකිරීම**<br>**03 තන්තිරිමලේ ශ්‍රී විමලඥාන ම.වි. සුළු අළුත්වැඩියා**<br>සභාපති- ඩී.ටී.ඒ.එස්.දිසානායක මයා, සමූපකාර සංවර්ධන කොමසාරිස්<br>සාමාජික - අයි.එම්.ඒ.ටී.දිසානායක මයා, ගණකාධිකාරී, පළාත් ආදායම් දෙපා.<br>සාමාජික - සී.එස්.කේධර්මසේන මයා ප.නිලධාරී, පළාත් ක්‍රීඩා දෙපා.<br>04 **හබරණ ම.වි. සෞන්දර්ය ඒකකය ඉදිකිරීම** | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | XVI. තන්තිරිමලේ ශ්‍රී විමලඥාන ම.වි.<br>XVII. තන්තිරිමලේ ශ්‍රී විමලඥාන ම.වි.<br>XVIII. හබරණ ම.වි.<br>XIX. තිරප්පනේ මහානාම ම.වි.<br>XX. සිවලාකුලම සීවලී ම.වි. | | සභාපති- එල්.එච්.වී.ඉරෝෂිනී මෙය, සහකාර ප.පා. කොමසාරිස්<br>සාමාජික - ඒ.යූ.ඩී.ප්‍රේමතිලක මයා, ගණකාධිකාරී, පළාත් අධ්‍යාපන දෙපා.<br>සාමාජික - ජේ.ඒ.ලලිතා රණසිංහ මිය, ප.නිලධාරී, පළාත් පාලන දෙපා.<br><br>• කමිටු වාර්තා මෙතෙක් ලබා දී නොමැත.<br>මෙම ව්‍යාපෘති 20 න් 2 ක් අළුත්වැඩියා ව්‍යාපෘති බවත් ඉතිරි 18 න් 17 ක වැඩ කෙරෙමින් පවතින බවත් එක් ව්‍යාපෘතියක් පමණක් ඉතිරිව ඇති බව ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී පවසන ලදී. | | | |
| 08 | පදවිය මහසෙන් මහ විද්‍යාලේ සහ පදවි ප්‍රාථමික විද්‍යාලේ ව්‍යාපෘති 02 සම්බන්ධයෙන් වැඩ අවසන් නොකර තිබීම, කාලය දීර්ඝ කර නොතිබීම සහ ප්‍රමාණ පත්‍රවල සඳහන් මිල ගණන්ම කොන්ත්‍රාත්කරු විසින් ලංසුව සඳහා ඉදිරිපත් කිරීම නිසා යම් වංචාකාරී ස්වභාවයක් පෙන්නුම් කිරීම. | මේ පිළිබඳව පත්කල කමිටුව වාර්තාව ලබා දී ඇත. එම වාර්තාව පදනම් කරගනිමින් මූලික විමර්ශනයක් සිදුකිරීම සුදුසු බව කමිටුවේදී තීරණය විය. | පහත විමර්ශන කමිටු පත් කර ඇත. 2025.08.15 දිනට පෙර වාර්තාව ලබා දෙන ලෙස දන්වා ඇත. ගොඩනැගිලි 02 හි ඉතිරි වැඩ මෙම වසරේ ප්‍රතිපාදනවලින් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.<br>B.M.R.ඒකනායක මයා, ගණකාධිකාරී, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය - සභාපති<br>G.W.P.M.ගලප්පත්ති මයා , ශ්‍රී.ලං.ඉ.සේ.III, පළාත් පාලන දෙපා. - සාමාජික<br>අමරසේන දිසානායක මයා,අ.වි.හා විම.නිලධාරී, පළාත් අ.වි.හා විම.දෙපා. - සාමාජික | කමිටු වාර්තා කඩිනමින් ලබා ගන්නා ලෙස දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් | 06 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | • කමිටු වාර්තාව මාර්තු 31 දිනට ලබා දෙන බවට දන්වා ඇති බව ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 09 | ලගම පාසල හොදම පාසල ව්‍යාපෘතියේ ද්විත්ව ගෙවීම-<br>නබඩවැව සුමංගල ම.වි.(මහවැලි ගොවි සංවිධානය)<br>නාගලකන්ද ම.වි(අබේවර්ධන කන්ස්ට්‍රක්ෂන්)<br>පරසන්ගස්වැව වි.(සාරවති කාන්තා ග්‍රාම.සං.සමිතිය)<br>පරීක්ෂණ වාර්තාව ලැබී නැත. | පරීක්ෂණය සඳහා නව කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගැනීමටත්, අය නොවන කොටසට අදාලව මු.රෙ. 104 (ප.මු.රී.54) පරීක්ෂණයක් සිදු කර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට පියවර ගත යුතු බව කමිටුව තීරණය කරන ලදී. | ද්විත්ව ගෙවීම් මුදලින් කොටසක් අයකරගෙන ඇති බවත්, තවදුරටත් ලක්ෂ 1 ½ ක් පමණ අයවීමට ඇති බවත් පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>මු.රෙ.104(4) කමිටුව පත් කර ඇත.<br>සභාපති- එච්.එම්.ජී.ඉන්දික මහතා, පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ<br>සාමාජික කේ.පී.අනුරාධා සෞම්‍යකාන්ති මිය, ගණකාධිකාරී, ම.නු.ප.ප්‍රා.ලේ.කාර්යාලය<br>සාමාජික - එම්.ජී.එස්.ප්‍රේමචන්ද්‍ර මයා ප.නිලධාරී, පළාත් සංස්කෘතික දෙපා.<br>• කමිටු වාර්තාව ලබා දී නැත. | | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් | 06 |
| | **පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව** | | | | | |
| 10 | කැබිතිගොල්ලෑව රෝහලේ බාහිර රෝගී අංශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වැඩ අවසන් නොකිරීම.<br>I. විමර්ශන වාර්තාව ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාකරුගෙන් තවදුරටත් රු. 1,261,621.69ක මුදලක් | මිල විචලන බිල්පතට ගෙවිය හැකිද යන්නට මැදවච්චිය ප්‍රාදේශීය ඉංජිනේරු වෙතින් පිළිතුරු ලද පසු, අය කර ගැනීමේ හැකියාවක් නොමැති වුවහොත් මු.රෙ.104( | මැදවච්චිය ප්‍රාදේශීය ඉංජිනේරුගේ අංක NCP/MED/DE/DO-1/H/2019/11 හා 2024.08.05 දිනැතිව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) ඇමතූ ලිපිය මගින් කොන්ත්‍රාත්කරු විසින් ගෙවීම් බිල්පත් 06 ක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ කිසිවක මිළ විචලන ඉල්ලා නොමැති බවත් දන්වා ඇත. | | ලේකම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය. | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | අයකර ගත යුතුව ඇත. මෙම මුදලින් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව මිල විචලනය සඳහා රු. 946,164.81ක මුදලක් කොන්ත්‍රාත්කරුට තව දුරටත් ගෙවීමට ඇති අතර, එම මුදල ගෙවීම සම්බන්ධව අනුමැතියක් ලබාගැනීම සඳහා මැදවච්චිය ප්‍රාදේශීය ඉංජිනේරු වෙත අංක RDHS/F4/PSDG/2019/90 හා 2024.11.29, NCP/AP/RDHS/AC/F04/2025/පොදු හා 2025.05.02 දිනැතිව ලිපි ඉදිරිපත් කර ඇත. ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුර අනුව අයකරගැනීමට අදාල ඉදිරි කටයුතු කරනු ලැබේ. | ප.මු.රී.54) පරීක්ෂාව සිදු කල යුතු බව කමිටුව දන්වන ලදී. | මු.රෙ 104 අනුව පරීක්ෂණ කමිටුවක් පත්කර ඇත.<br>සභාපති - වෛද්‍ය ධම්මික ද සිල්වා මයා<br>සාමාජික - එස්.එස්.එන් දිසානායක මයා- ගණකාධිකාරි<br>සාමාජික - සිවිල් ඉංජිනේරු එච්.එම්.ආර්.එම් අබේරත්න මයා<br>මේ සම්බන්ධයෙන් අදාල සියලු පාර්ශව කැඳවා 2026 ජනවාරි මස 30 වන දින පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ දී සාකච්ජා කල බවත්, එහිදී නැවත ගොනුව පරීක්ෂා කර මිල විචලනය ගෙවිය හැකි නම් නව මිල විචලන වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇති අතර ඒ අනුව රු.420,801.71 ක මිල විචලන වාර්තාව 2026.02.27 ලබා දී ඇති බවත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී. එසේම කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට ඇති මුදලින් හැකි තාක් අය කිරීම් කර ගන්නා ලෙස උපදෙස් දී ඇති බවද ප්‍රකාශ කරන ලදී.<br>තවදුරටත් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට ඇති මුදල රු. 797,939.81 කි. | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | වැලිකන්ද මූලික රෝහලට අනුයුක්ත කර ඇති LW 1975 දරණ ගිලන්රථයට සිදුව තිබූ අනතුර<br>I. ගිලන්රථය ලියාපදිංචි කිරිමට කටයුතු කල යුතුවේ.<br>II. වෛද්‍යවරයා සම්බන්ධයෙන් ගනු ලබන විනය ක්‍රියාමාර්ග වල ප්‍රගතිය විමසා බැලිමට කටයුතු කල යුතු බවට තීරණය විය. | මු..රෙ.104(ප.මූ.රී.54) පරීක්ෂාව සිදු කර අලාභය බෙදී යන ආකාරය අනුව අයකල යුතු බවත්, ඒ අනුව ඉදිරි කටයුතු කල යුතු බවත් කමිටුව තීරණය කරන ලදී. | I. මූලික විමර්ශන කටයුතු අවසන් කර ඇත. රියදුරුට විනය නියෝගයක් ලබා දී ඇත. (මාසික විශ්‍රාම වැටුපෙන් 5% අය කිරීම) සෙසු චූදිත නිලධාරින්ගේ චෝදනා පත්‍ර කෙටුම්පත් විනය බලධාරින් වෙත යවා ඇත.<br>II. මු.රෙ.104 පරීක්ෂණය කමිටුව 2025.12.15 දින පත් කර ඇත.<br>සභාපති - නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය ඩී.ජී.එන් සමරුතිලක මහතා<br>සාමාජික -ඊ.එන්.සී හේරත් මහතා ගණකාධිකාරි,පොලිස් අධිකාරි කාර්යාලය,අනුරාධපුරය<br>සාමාජික -ආර්.එම.ඩබ්.එස්.බී රත්නායක මහතා,පරිපාලන නිලධාරි, පළාත් සෞඛ්‍ය සේවා දෙපා. | | ලේකම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 09 |
| 12 | **අභ්‍යන්තර දූරකථන පද්ධති ස්ථාපිත කිරීම**<br>පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිගුරක්ගොඩ රෝහලේ අභ්‍යන්තර දූරකථන පද්ධති ස්ථාපිත කිරීමේ දි සැලසුම් කරන ලද දූරකථන ප්‍රමාණයට වඩා අඩුවෙන් සවිකර ඇති බවත් දූරකථන 50 ක ප්‍රමාණයක් සවි නොකර, ඒ වෙනුවෙන් | වගකිව යුත්තන් හදුනාගෙන රජයට වූ අලාභය අය කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | මූලික විමර්ශන කටයුතු අවසන් කර ඇත. චූදිත නිලධාරින්ගේ චෝදනා පත්‍ර කෙටුම්පත් විනය බලධාරින් වෙත යවා ඇත.<br>මේ සම්බන්ධයෙන් මු.රේ 104 පරීක්ෂණයක් සිදු කිරීම සඳහා පහත නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. | සවිකර නොමැති දූරකතන 50 ක් වෙනුවෙන් ගෙවා ඇති බව අභ්‍යන්තර විගණනය මගින් පෙන්වා දී ඇති අතර, මේ සඳහා ඒ අවස්ථාවේදීම ක්‍රියාමාර්ග | ලේකම්, ප.සෞඛ්‍ය අමාත්‍යා./පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, උ.මැ.ප. | 08 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වටිනාකම වූ 2200*50 සඳහා රු.110,000.00ක මුදලක් ගෙවා ඇති බව. (බිල්පතින් නිර්දේශ කර ඇති ප්‍රමාණය දුරකථන 30. ගෙවීම් කර ඇති ප්‍රමාණය දුරකථන 80.) | | 1. සභාපති - නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය ඩී.ජී.එන් සමරුතිලක මහතා<br>2. සාමාජික - ගණකාධිකාරි ඒ.එම්.ජේ ඉලංගසිංහ මහතා<br>3. සාමාජික - පරිපාලන නිලධාරි යූ.ඒ ධම්මික මහතා -.<br>මූ.රෙ 104 වාර්තාව සකස් කරමින් පවතින බවත් 2026.03.31 දිනට ප්‍රථම ලබා දිමට කටයුතු කරන බවත් දන්වා ඇති බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී. | ගත හැකිව තිබියදී එසේ කටයුතු නොකර මෙය දැනට සංකීරණ ගැටළුවක් බවට පත් කර ගෙන ඇති බව ජොෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. | | |
| 13 | නාච්චාදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉදිකිරීම සඳහා රු.43,038,725ක වටිනාකමට අදාලව 2021 උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ගිවිසුම්ගතව රු.12,660,000 ක අත්තිකාරම් මුදල් ද ගෙවා තිබූ අතර කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය අතහැර දමා ඇත. | නාච්චාදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉදිකිරීමට අදාලව පැවති ඉඩමේ අයිතිය නිරවුල්ව ඇති බැවින් නව ව්‍යාපෘතියක් ලෙස වැඩ ආරම්භ කිරිමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු බවත්,කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද බිල්පත සම්බන්ධයෙන් ඉදිරි කටයුතු විමර්ශන වාර්තාව අනුව සිදු කිරිමටත් උපදෙස් ලබා දෙන ලදී. | I. උසාවි නියෝගයක් මගින් බැදුම්කරයෙන් කොටසක් අයකර ගෙන ඇති බවත්, තවදුරටත් රුපියල් පන්ලක්ෂ පන් දහසක මුදලක් අයවීමට ඇති බවත්, ඒ සඳහාද ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.<br>II. පරීක්ෂණය සඳහා පහත කමිටුව පත්කර 2025.04.10 දිනට පෙර වාර්තාව ලබා දෙන ලෙස දන්වා ඇත.<br>සභාපති - ආර්.පී.කමිත්‍රා මිය,ප්‍රධාන ගණකාධිකාරී,පළාත් භාණ්ඩාගාරය | . | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/ ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය/නි යෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු | 09 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | සාමාජික -ජේ.රලියුදීන් මහතා, අධ්‍යක්ෂ, පුහුණු ඒකකය<br>සාමාජික -එම්.ඒ.ප්‍රසාදිකා මිය,ප.නිලධාරී, පුහුණු ඒකකය.<br>• පරීක්ෂණ වාර්තාව මෙතෙක් ලබා දී නැත.<br>• මු.රෙ.104 පරීක්ෂණය සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් 2025.12.22 දින පහත කමිටුව පත් කර ඇත.<br>සභාපති - ඊ.එම්.සී.හේරත් මයා, ගණකාධිකාරී, පළාත් පාලන දෙපාර්තමේන්තුව,උ.මැ.ප.(පොලිස් දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී ගොස් ඇත.)<br>සාමාජික - ඩබ්.ඒ.සී.කේ.වික්‍රමසිංහ මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ(පාලන), පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>සාමාජික - වෛද්‍ය ඉන්දීවරී බුලත්සිංහල මිය, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | | |
| 14 | සතියට දින දෙකක් පදවිය රෝහලේ සේවය කිරීමට යටත්ව වැලිසර නාවික රෝහලට මුදාහැර තිබූ වෛද්‍ය ඩබ්.ඒ.ආර්.වී වේරගොඩ මිය 2022.12.29 දිනෙන් පසුව විගණිත දින වූ 2024.01.04 දින තෙක්ම කිසිදු දවසක් පදවිය රෝහලේ සේවය සඳහා වාර්තා නොකර තිබියදී 2023 | වැලිසර නාවික රෝහල මගින් අදාල නිළධාරිණිය වෙත වැටුප් ගෙවා නොමැති බවට ලිපියක් යොමු කර ඇති බවත්, අතිකාල දීමනා පමණක් ගෙවා ඇති බව දන්වා ඇති බවත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කල අතර , මෙම | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අංක NCP/PDHS/FA/විගණන කමිටු/2026 හා 2026.02.24 දිනැති ලිපිය මගින් වැටුප් ප්‍රතිපූරණය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ එකගතාවය විමසා ඇත. | පළාතේ රෝහල්වලට එවනු ලබන විශේෂඥ වෛද්‍යවරුන් පළාතට සේවයක් නොගෙන ආපසු යැවීමෙන් පළාතට | පළාත් සෞඛය සේවා අධ්‍යක්ෂ/ ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය. | 07 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වර්ෂය සහ 2024 ජනවාරි මස තෙක්ම වැටුප් ගෙවා තිබුණි. | වෛද්‍යවරියට ගෙවා ඇති වැටුප ප්‍රතිපූරණය කිරීමට රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් එකග වූ බව නියෝජ්‍ය පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී.<br>● එකගතාවය ලිඛිතව ලබාගෙන වැටුප් ප්‍රතිපූරණය ලබා ගන්නා ලෙසත්, ඉදිරියේදී මෙවැනි දේ සිදු නොවීමට පියවර ගත යුතු බවටත් තීරණය විය. | | සිදුවන හානිය පිළිබද ජ්‍යොෂ්ඨ සහකාර විගණකාධිපති ප්‍රකාශ කරන ලදී.<br>මෙය පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු මට්ටමින් පාලනය කිරීමේ ගැටළු සහගත බව පිළිබද අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කරුණු දක්වන ලදී. මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් මගින් රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකරන ලෙසත්, එහි පිටපතක් ජාතික විගණන කාර්යාලය හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | ලබා දෙන ලෙසත් දන්වන ලදී. | | |
| 15 | **කාර්ය මණ්ඩලය පිළිබඳ විගණන පරීක්ෂාව -කැබිතිගොල්ලෑව මූලික රෝහල** කැබිතිගොල්ලෑව මූලික රෝහලේ සේවයේ නියුතු නිලධාරීන් / සේවකයින් නොදන්වා සේවයට වාර්තා කර නොමැති අතර සේවය අතහැර ගොස් මාස කිහිපයක් ගත වන තුරු වැටුප් ගෙවීම් සිදු කර ඇති අතර පුහුණුවට වාර්තා කිරීමේදී ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව පුහුණු කාලසීමාවේදී ගෙවන ලද වැටුප්, ගාස්තු, අත්තිකාරම් මුදල් දීමනා ඇතුළත් සියළු වියදම් සහ ඇපකරයේ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1. විදේශ ගත වී ඇති නිළධාරින්ගෙන් අයවිය යුතු මුදල් ගණනය කර, රජයේ මුදල් සම්බන්ධයෙන් වංචනික ක්‍රියාවක් සිදු කර විදේශ ගත වූ බවට ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවන බවට සහ ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවට සඳහන් කර එක් එක් නිලධාරින්ගේ පුද්ගලික ලිපිනයන් වෙත ලිපි යැවිය යුතු බවටත්, ඒ අනුව අදාල මුදල් අය කර ගැනිමට කටයුතු කරන ලෙස දන්වන ලදී.<br><br>2. වැටුප් ලේඛන අත්සන් කිරීමට සාධාරණ කාලයක් ලබාදී එම කාලයෙන් පසුවත් වැටුප් ලේඛන අත්සන් නොකරන නිලධාරීන්ගේ වැටුප් නතර කිරීමට පියවර ගැනීම සුදුසු බව. | **ඊ.එම්.ඩී.එස්.ඒකනායක මිය(සේවය හැර ගොස් ඇත)** - මෙම නිලධාරිණියගෙන් පුහුණු කාල සීමාවට අදාලව රජය විසින් දරන ලද වියදම වෙනුවෙන් රු. 1,169,474.22ක මුදලක් අයවීමට ඇති අතර, වැඩිපුර ගෙවා ඇති වැටුප් හා දීමනා මුදල රු. 81,036.30කි. රු. 1,169,474.22ක මුදල මසකට රු. 32,500.00බැගින් වාරික 36කින් ගෙවීමට ලිපියක් ඉදිරිපත් කර ඇත. මෙම මුදලින් දැනට රු. 162,500.00ක් ගෙවා ඇත. ඒ අනුව තව දුරටත් ගෙවීමට ඉතිරිව ඇති මුදල රු. 1,006,974.22 කි.<br>වැටුප වශයෙන් ගෙවා ඇති රු. 81,036.30ක මුදලින් රු. 40,000.00ක මුදලක් L/1060737 - 2025.12.29 දින ගෙවීම් කර ඇත. වැඩිපුර ගෙවන ලද වැටුප් වලින් තවදුරටත් රු. 41,036.30ක මුදලක් අයවීමට ඇත.<br><br>N.D.N.L.දිසානායක මයා - මෙම නිලධාරියව නැවත සේවයේ පිහිටුවා ඇති අතර, වැඩිපුර ගෙවා ඇති රු. 99,045.35ක මුදල මාසික වැටුපෙන් | සේවය හැර ගොස් ඇති බවට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් ඊට වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කටයුතු කල යුතු බවටත්,<br>අය කර ගත නොහැකි මුදල් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතු බවත් දන්වන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යංශය,<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | 07 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 3. මෙම තත්වය ඉදිරියේදී සිදු නොවීමට සෑම මාසයකටම අදාලව සියළු ආයතනවලින් වැටුප් ගෙවිය යුතු අයගේ නාම ලේඛණයක් ගෙන්වා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කරගන්නා ලෙසත් එහි නම් සදහන් අය වෙත පමණක් මාසිකව වැටුප් ගෙවීමට පියවර ගන්නා ලෙසත් දන්වන ලදී.<br><br>අයකර ගත නොහැකි වැටුප් සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණයක් සිදුකර වැරදි ලෙස වැටුප් ගෙවීමට කටයුතු කර ඇති නිලධාරීන් හදුනාගෙන ඔවුන් වෙතින් එසේ අයකරගත නොහැකි මුදල අය කිරීමට පියවර ගත යුතු බව දන්වන ලදී. | අයකරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව 2026 පෙබරවාරි මස වැටුපෙන් රු. 9,045.35ක මුදලක් අයකර ගැනීමටත්, ඉතිරි රු. 90,000.00ක මුදල මසකට රු. 15,000.00 බැගින් මාස 06 කින් අයකරගැනීමටත් කටයුතු කරනු ලැබේ.<br><br>**K.G.B.D.කොස්වත්ත මෙය** - මෙම නිලධාරිනිය වෙත වැඩිපුර ගෙවා ඇති වැටුප හා දීමනාව රු. 580,097.91කි. ඇප මුදල වශයෙන් රු. 200,000.00ක්ද නැවත රජයට ගෙවීමට ඇත. ඒ අනුව අයකරගැනීමට ඇති මුළු මුදල රු. 780,097.91කි<br><br>J.R.S.ජයතිලක මයා - සේවයට වාර්තා කර නැවතත් සේවය අතහැර ගොස් ඇත.<br>වැටුප් රහිත නිවාඩු වෙනුවෙන්<br>අයවීමට ඇති මුළු මුදල - රු. 67,530.00<br>අඩුකළා:<br>2021 අගෝස්තු හා සැප්තැම්බර්<br>මස වාරික 02ක් පමණක් අයකිරීම<br>5,194.61 x 2 - රු. 10,389.22<br>තව දුරටත් අයකළ යුතු මුදල - රු. 57,140.78 | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2023 සැප්තැම්බර් මස 13 දින සේවය හැර යන විට එම මසට අදාල මුළු වැටුපම ගෙවා ඇති බැවින් නැවත දින 18කට මුදල් අයකර ගත යුතුව ඇත. 2023 ඔක්තෝම්බර් මස වැටුප ගෙවීම නතර කර ඇත.<br><br>වැඩිපුර ගෙවා ඇති වැටුප - රු. 13,316.40<br>වැඩිපුර ගෙවා ඇති දීමනාව - රු. 12,073.19<br>වැඩිපුර ගෙවා ඇති මුළු මුදල- රු. 25,389.59<br><br>ඒ අනුව අයකරගත යුතු මුළු මුදල<br>- රු. 57,140.78<br>- රු. 25,389.59<br>- රු. 82,530.37<br>සේවය හැර ගොස් ඇති බවට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කටයුතු කිරීමට මූලික විමර්ශනයක් සිදු කරන බව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 16 | අනුරාධපුර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍ය ක්ෂ කාර්යාලයට අදාල ගෙවීම් වවුචර්පත් අ නුක්‍රමික අංක පිළිවෙලින් ගොනු ගත නො | ගෙවූ වවුචර්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා | තවදුරටත් හිග වවුචර් -<br>2023 ජනවාරි 04 95,868.09<br>පෙබරවාරි 04 524,216.20 | දැනට වවුචර් අස්ථානගතවීම වැලැක්වීමට ගෙන ඇති | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, | 06 |

<table>
<tr>
<td></td>
<td>කර රඳවා තබා ගෙන ඇති බව සහ පරීක්ෂා කරන ලද වවුචර් අතර එක් එක් මාසයට අදාල පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් සැලකිය යුතු වවුචර ප්‍රමාණයක් හිඟව පැවති බව අනාවරණය විය.<br>
<table>
<tr><th>මාසය</th><th>මාසයට අදාලව තිබූ මුළු වවුචර් ගණන</th><th>හිඟව පැවති වවුචර් ගණන</th></tr>
<tr><td>2023 ජනවාරි</td><td>308</td><td>14</td></tr>
<tr><td>2023 පෙබ.</td><td>433</td><td>85</td></tr>
<tr><td>2023 මාර්තු</td><td>590</td><td>68</td></tr>
<tr><td>2023 අප්‍රේල්</td><td>668</td><td>83</td></tr>
</table></td>
<td>වගකිව යුතු බව කමිටුව විසින් දන්වන ලදී.<br>අනුරාධපුර ප්‍රාෙද්ශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නිලධාරීන් ස්ථාන මාරු වී යාමේදී නිසි පරිදි කටයුතු නොකිරීම මත මෙම තත්වය පැන නැගුන බව දන්වමින් මෙම වවුචර් හිගය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු බවත්, ඒ සම්බන්ධයෙන් දැනුම් දී ඇතත් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් ප්‍රකාශ කරන ලදී.</td>
<td>මාර්තු 03 681,730.68<br>අප්‍රේල් <u>06</u> <u>145, 595.23</u><br>එකතුව <u>17</u> <u>1,447,410.20</u><br>රජයට අලාභයක් වී ඇද්ද යන්න හඳුනාගැනීමට මූලික විමර්ශන කමිටුවක් පත් කර ඇති බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>සභාපති - ඩී.ජී.එන් සමරුතිලක මහතා, නි.ප.සෞ. සේ.අධ්‍යක්ෂ<br><br>සාමාජික- ජගත් පුෂ්පකුමාර මහතා, පරිපාලන නිලධාරි, කලාප අධ්‍යාපන කාර්යාලය,අ/පුර<br><br>සාමාජික - මයාදුන්න මිය, සං. නි.,පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br><br>2024 වර්ෂයේ හිග වවුචර් 04 ක් ද පවතින බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් දන්වන ලදී.</td>
<td>ක්‍රියාමාර්ග පිළිබඳ විමසමින් සෑම මසකටම අදාලව Cigas මගින් ගෙවීම් සාරාංශයක් ලබාගෙන සියළු වවුචර් ඇති බවට එය සමග සසදා සනාථ කර ගැනීමෙන් පසු එම සාරාංශයද සමග ගෙවූ වවුචර් ගොණුගත කර තැබිය යුතු බව දන්වන ලදී. (මෙය සියළු කාර්යාලයන් අදාල කර ගන්නා ලෙස ද උපදෙස් දෙන ලදී.)<br>ඉකුත් ගෙවීම් සිදු කරන්නේ නම් බැරකම් ලේඛනයක් පවත්වා ගත යුතු බවත්, එය අදාල එක් එක් විෂය භාර නිලධාරීන්ගේ වගකීමක් බවත් දන්වන ලදී.</td>
<td>අ/පුර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ</td>
<td></td>
</tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | අස්ථානගතවී නැවත සොයාගෙන විගණනය වෙත ඉදිරිපත් කර ඇති ඇතැම් වවුචර්පත් ගැටළු සහගත බැවින් විගණනය වෙත ඉදිරිපත් කල එම සියළු වවුචර්පත් සම්බන්ධයෙන් නැවත විගණනයක් සිදු කරන බව පළාත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් දන්වන ලදී. | | |
| 17 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත බලතල පැවරීම. 2024.07.24 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රෙල්ඛ 2024/08 ප්‍රාෙද්ශීය ප්‍රසම්පාදන කමිටු සීමාව රු.මි.5, රු.මි.7.5 ඉක්ම වූ අවස්ථා 03 ක් විගණනයට නිරීක්ෂණය විය. (ex- air conditioner-5.13, drug counter chair 6.17, Trolley 5.29)<br>මෙම විගණන විමසුම සඳහා මෙතෙක් පිළිතුරු ලබා දී නොමැති බව ප්‍රකාශ කරන ලදී. | | මෙය විදේශ අරමුදල් සම්බන්ධ ව්‍යාපෘති වන බැවින් දක්වා ඇති ප්‍රසම්පාදන කමිටු සීමාවන් මේ සඳහා අදාල නොවන බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br>ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලද්දේ මේ තුල ටයර් මිලදී ගැනීමක් ඇති බවත්, එය විදේශ අරමුදල් මගින් සිදු කරන ලද මිලදී ගැනීමක් නොවන බවය. ඒ බව පළාත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින්ද සනාථ කරන ලදී. | මෙම විගණන විමසුමට මෙතෙක් පිළිතුරු ලබා දී නොමැති බැවින් වහාම පිළිතරු ලබාදෙන ලෙසත්, ඒ අනුව නැවත පරීක්ෂාවක් සිදු කරන බවත් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් දන්වන ලදී.<br>මෙහි ප්‍රගතිය පළාත් අමාත්‍යාංශ විගණන | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සියළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් | 04 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | කමිටුවේදී සාකච්ඡා කිරීමට තීරණය විය. | | |
| | **පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව** | | | | | |
| 17 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් බැදිවැව ප්‍රදේශයේ පිහිටි හෙල රස පියස ගොඩනැගිල්ල | අළුත්වැඩියාව කඩිනමින් සිදු කර තෝරා ගන්නා ගැනුම්කරු වෙත බදු දීමට කටයුතු කරන බව ප්‍රකාශ විය. | අළුත්වැඩියාව අවසන් කර ඇති නමුත් තෝරාගත් ලංසුකරු විසින් අදාල ගොඩනැගිල්ල භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇති අතර, මිල ගණන් ඉදිරිපත් කර තිබූ අනෙක් ලංසුකරුද භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් නැවත 2026 වර්ෂයට මිළ ගණන් කැඳවීමට කටයුතු කර ඇත. (අවම මිල රු.50,000.00 කට යටත්ව) | මෙහි ප්‍රගතිය පළාත් අමාත්‍යාංශ විගණන කමිටුවේදී සාකච්ඡා කිරීමට තීරණය විය. | පළාත් ආයුර්වේද කොමසාරිස් | 06 |
| | **පළාත් පරිවාස දෙපාර්තමේන්තුව** | | | | | |
| 18 | අවන්තිදේවී ළමා නිවාසයේ රාත්‍රී කාලයේ උත්සවයක් පැවැත්වීම හා එහිදී පිරිමි ,නිලධාරීන් මත්පැන් පානය කිරීම දැරියක මෙහෙකාර සේවයේ යෙදවීම ආදී කරුණු සම්බන්ධයෙන් හිටපු පරිවාස කොමසාරිස්වරයෙකු හා ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරිණියක අත්අඩංගුවට ගෙන ඇප මත නිදහස් කිරීම සම්බන්ධයෙන් එහි වර්ථමාන තත්ත්වය පිළිබඳ සොයා බැලීම. | ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරිණිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂනය සඳහා කමිටුවක් පත් කර ඇත.<br>සභාපති - ඩබ්.එම්.ගයාන් ඉන්දික මහතා, පලාත් ක්‍රීඩා අධ්‍යක්ෂ<br>සාමාජික - එස්.ඒ.ගුණසේකර මෙය, පරිපාලන නිලධාරී, තඹුත්තේගම රෝහල<br>සාමාජික - ඒ.කේ.සී.කේ.රත්නසේකර මයා. | කමිටු වාර්තාව සති දෙකකින් ලබා දෙන බව කමිටු සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරිණිය සම්බන්ධයෙන් වන නඩුව නැවත 2026.06.06 දිනට කැඳවා ඇත. | | පළාත් පරිවාස කොමසාරිස් | 04 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | සංවර්ධන නිලධාරී, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය<br>• මෙම නිලධාරිණිය සම්බන්ධව අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව නීතිපති උපදෙස් ලැබෙන තෙක් 2026.03.09 දින දක්වා කල් තබා ඇත.<br>පළාත් පරිවාස කොමසාරිස් සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පරීක්ෂණයක් සිදු කර ඇත. චෝදනා පත්‍ර නිකුත් කිරීමට තරම් කරුණු අනාවරණය නොවන බව වාර්තා කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) විසින් දන්වන ලදී. | | | | |
| | **පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව** | | | | | |
| 19 | ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අංක NCP/IA/03/SS/19//25-67 හා 2025.08.19 දින නිකුත් කරන ලද විගණන වාර්තාව සඳහා පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් | අතරුදවූම් මුදල් මෙතෙක් නිදහස් කර නොමැති බැවින් අතරුදවූම් මුදල් මගින් අඩුපාඩු නිවැරදි කර ගත | තාක්ෂණ කමිටුවක් පත් කර සති දෙකක් ඇතුලත වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇති බව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ (වැ.බ.) විසින් ප්‍රකාශ කරන ලදී. | | පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ , සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්/නි. | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | අංක NCP/SS/F1/34 (II) හා 2025.11.21 දිනැති ලිපිය මගින් පිළිතුරු සපයා ඇති අතර එහිදී පෙන්වා දුන් දෝශ නිවැරදි කර ඇති බව දන්වා ඇතත් 2025.12.15 දින සිදු කරන ලද පසුවිපරම් පරීක්ෂාව අනුව වාර්තාවෙහි 6.1 (අ) ඡේදය හා 6.1 (ඇ) ඡේදය මගින් දක්වා ඇති දෝෂයන් තවදුරටත් පවතින බව දෘෂ්‍යමාන විය. | හැකි බව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලදී.<br>මෙවැනි තත්වයන් ඉදිරියේදී ඇති නොවන පරිදි කටයුතු කිරීමට තාක්ෂණ අංශ අවධානය යොමු කල යුතු බව දන්වන ලදී. | | | ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් | |
| | **පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව** | | | | | |
| 20 | නොච්චියාගම නූල් වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයට අදාලව විගණන වාර්තාවක් නිකුත් කර ඇති බවත්, මෙම මධ්‍යස්ථානය සඳහා 2021 වර්ෂයේදී රේඛීය කර්මාන්ත අමාත්‍යාංශය මගින් රු.මිලියන 17.480ක ප්‍රතිපාදනයක් ද පළාත් භාණ්ඩාගාරය මගින් රු. මිලියන 10 .772 ක ප්‍රතිපාදනයක් ද ලබා දී තිබූ අතර, එම ප්‍රතිපාදන වලින් 2023.12.31 වන විට රු.28,172,394.33 ක මුදලක් වියදම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් යන්ත්‍ර සවිකර ක්‍රියාත්මක කිරීමට පෙර හා අවශ්‍ය යටිතල පහසුකම් සපුරා ගැනීමට පෙර සෝඩියම් ක්ලෝරයිඩ්, වර්ණක ඇතුළු රසායනික ද්‍රව්‍ය | රජයේ ආයතන ව්‍යාපාර කටයුතුවලට යොමුවීමේදී මෙවැනි අසාර්ථක ව්‍යාපෘති පාඩමකට ගත යුතු බව කමිටු සභාපති විසින් අවධාරණය කරන ලදී.<br>මෙම යන්ත්‍ර නැගෙනහිර පළාත් සභාව වෙත ලබා දීමට නැවත අවධානය යොමු කරන ලෙස දන්වන ලදී. | මෙය ඉදිරියේදී ඵලදායී ලෙස භාවිතයට ගැනීමට අපේක්ෂා කරන බව 2026.03.05 දින පැවති පළාත් සමූපකාර අමාත්‍යාංශ විගණන කමටුවේදී පළාත් සමූපකාර ලේකම් විසින් දන්වන ලදී.<br>දැනට තිබෙන අමුද්‍රව්‍ය යොදා ගෙන නූල් වර්ණ ගැන්වීම සිදු කරන බවත්, පරිසර සහතිකය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බවත් පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලදී. | මෙහි ප්‍රගතිය විමසීමට අමාත්‍යාංශ විගණන කමිටුවට යොමු කිරීමට තීරණය විය. | ලේකම්, පළාත් සමූපකාර අමාත්‍යාංශය/ පළාත් කර්මාන්ත සං.අධ්‍යක්ෂ | 04 |

<table>
<tr><td></td><td>සහ නූල්, දර ආදිය මිලදීගෙන තිබූ බව ද ප්‍රකාශ කරන ලදී. එසේම ක්ෂේත්‍ර පරීක්ෂාවේදී බොයිලේරුව සවිකර ඇති ගොඩනැගිල්ලෙහි වහලය දෙපසින් සුළං වැස්සට වැසි ජලය බොයිලේරුව ඉහල කොටසට (Safety Valve ඇතුලුව) පතිත වීමෙන් බොයිලේරුව මළ බැඳී විනාශ වෙමින් පවතින බවද, මිලදී ගත් රසායන ද්‍රව්‍යය විනාශ වෙමින් පවතින බව ද නිරීක්ෂණය වූ බව ප්‍රකාශ කරන ලදී.</td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td colspan="6">පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>21</td><td colspan="3">සමුපකාර සමිතිවල ගිණුම් තැබීමේ දෝෂ පැවතීම හා විගණනයන් ප්‍රමාද කිරීම .<br>2026.03.06 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ සහ විගණන නිම කිරීමේ ප්‍රගතිය -<br>
<table>
<tr><th>අනු අංකය</th><th>විවිධ සේවා සමුපකාර සමිතිය</th><th>අවසන් වරට මූල්‍ය ප්‍රකාශන ලද මුදල් වර්ෂය</th><th>මූල්‍ය ප්‍රකාශය ලැබිය යුතු මුදල් වර්ෂය</th><th>අවසන් වරට විගණනය කල මුදල් වර්ෂය</th><th>විගණනය කල යුතු මුදල් වර්ෂය</th></tr>
<tr><td>1</td><td>සී/ස ඇලහැර විවිධ සේවා සමු. සමිතිය</td><td>2024.12.31</td><td>2025.12.31</td><td>2020.12.31</td><td>2020.01.01 සිට 2021.12.31 දක්වා විගණනය ආරම්භ කර දින 10 ක් ඉතිරිව ඇත. 2022.12.31 ට විගනනය ආරම්භ කර ඇත.</td></tr>
<tr><td>8</td><td>සී/ස මැදිරිගිරිය විවිධ සේවා සමු. සමිතිය</td><td>2024.12.31</td><td>2025.12.31</td><td>2020.12.31</td><td>2021.12.31 ට විගණනය ආරම්භ කිරීමට කටයුතු කර ඇත.</td></tr>
</table></td><td>කවුඩුල්ල සමුපකාර සමිතියේ ප්‍රමාද වී ඇති ගිණුම් පුද්ගලික ආයතනයක් මගින් සකස් කරවා ගැනීමට උපදෙස් ලබා දුන් බව පළාත් සමුපකාර කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.</td><td>පළාත් සමු.සං.කොමසාරිස්/ලේකම්, පළාත් සමුපකාර අමාත්‍යාංශය</td><td>07</td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| 9 | සී/ස කවුඩුල්ල විවිධ සේවා සමු .සමිතිය | 2019.12.31 | 2020.01.01-2025.12.31 | 2018.12.31 | 2019.12.31 දිනට විගණනය ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 22 | **වීරපුර සණස සමිතියේ මූල්‍ය වංචාව**<br>කළමණාකරු සහ සහය කළමණාකරු විසින් 2014 සිට 2020 වර්ෂය දක්වා සිදු කරන ලද රුපියල් මිලියන 49 ක මූල්‍ය වංචාව සිදුවන කාලයේ නිලධාරින් 09 දෙනෙකු සේවය කර ඇති අතර ඔවුන්ගෙන් 05 දෙනෙකු මේ වන විට රාජකාරියේ යෙදී සිටින බවත් එයින් එක් අයෙකු මෑතකදි විශ්‍රාම යාමට නියමිතව සිටින අතර එම නිලධාරිණිය පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන බවත් එම නිලධාරින් 05 දෙනාගෙන් නිදහසට කරුණු විමසීමේ දී ඔවුන් විසින් ඉදිරිපත් කල කරුණු පිළිගත නොහැකි බැවින් මූලික විමර්ශනයක් සිදු කල යුතු බවත් සමුපකාර කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | සී/ස වීරපුර ස.ණ.ස.සමිතියේ 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සිදුව ඇති මූල්‍ය වංචාව රු.49,927,001.75 කි. 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සිදුකරන ලද දෙපාර්තමේන්තු විගණනයේදී මෙම තත්ත්වයන් අනාවරණය කරගෙන ඇත. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ. | පළාත් සමූ.සං.කොමසාරිස්/ලේකම්, පළාත් සමුපකාර අමාත්‍යාංශය | 08 |

| වර්ෂය | මූල්‍ය වංචාව (රු.) | අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2014 | 5,558,700.28 | පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේදී උසාවි නඩු අංක 72513 යටතේ 2025.06.26 දින සම්පූර්ණ මුදලම එකවර ගෙවන ලෙසට තීන්දුව ලබාදී ඇත. |
| 2015 | 6,599,806.77 | එස්/432/පො යටතේ තීරකවරයා ලෙස එස්.ජේ.රාජපක්ෂ මයා පත්කර ඇත. විභාග කටයුතු අවසන් වී ඇත. ප්‍රදානය ලබාදීමට තිබේ. |
| 2016 | 6,647,378.00 | උසාවි නඩු අංක 72514 යටතේ 2025.06.26 දින පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේදී සම්පූර්ණ මුදලම එකවර ගෙවන ලෙසට තීන්දුව ලබාදී ඇත. අදාල මුදල නොගෙවුහොත් මාස 06 ක සිරදඬුවම් නියම කර ඇත. වගඋත්තරකරුවන් දෙදෙනා මේ වනවිට බන්ධනාගාර ගත කර ඇත. |
| 2017<br>2018 | 14,582,966.99 | S/459/පො යටතේ තීරකවරයා ලෙස ආර්.එම්.පී.ඒ.කේ.රාජකරුණා මිය පත්කර ඇත.විභාග කටයුතු සිදුකරමින් පවතී. (2017 වර්ෂයේ මූල්‍ය වංචාව රු.500,000.00 කි. S/459/පො යටතේ තීරකවරයා ලෙස පී.ජී.කේ.ෆොන්සේකා මයා පත්කර ඇත. විභාගකටයුතු සිදුකරමින් පවතී.) |

<table>
<tr><td></td><td></td><td colspan="3"><table><tr><td>2019<br>2020</td><td>15,717,062.10</td><td>S/466/පො යටතේ තීරකවරයා ලෙස ඩී.එන්.කොඩිතුවක්කු මයා පත්කර ඇත. විභාග කටයුතු අවසන් කර ඇත. ප්‍රදානය ලබාදීමට තිබේ.</td></tr><tr><td>2021</td><td>587,577.95</td><td>විගණනයෙන් පසු මුදල් වංචාව අනාවරණය කරගෙන ඇත. තීරකකරණයට යොමු කර මුදල් අයකර ගැනීම සිදුකල යුතුව ඇත. එන්තරවාසි නිකුත් කිරීම සිදුකර ඇත.</td></tr></table><br>• එවකට පොළොන්නරුව සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කල පී.ඊ.එම්.ආර්.පී.පලිපාන මිය වයස අවුරුදු 60 සම්පූර්ණවීම මත, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ 12 වගන්තිය යටතේ පනවා ඇති රෙගුලාසි වලට අනුකූලව 2024.08.13 දින විශ්‍රාම ගන්වා ඇත. (එන්සීපී/පීඑස්සී/1/12/21-ii හා 2025.07.14 දිනැති ලිපිය මගින්)<br>• මූල්‍ය අක්‍රමිකතාව පිළිබඳ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මූලික විමර්ශන වාර්තාව 2026.02.10 දින ලබා දී ඇත. එම වාර්තාව අනුව සහකාර කොමසාරිස්තුමිය විශ්‍රාම ගැන්විය හැකි බැවින් ඒ සඳහා වන නිර්දේශ ලබාදුන් බව පළාත් සමුපකාර කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.<br>• මූලික විමර්ශන වාර්තාව මගින් අධීක්ෂණ දුර්වලතා අනාවරණය කර ඇති බවත්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් පළාත් සමුපකාර කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.</td><td></td><td></td></tr>
<tr><td>23</td><td>සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය සඳහා මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා ආහාර දෙපාර්තමේන්තුව මගින් රු.මිලියන 43 ක මුදලක් වී මිලදී ගැනීම සඳහා ලබා දී ඇතත් එකී සමිති විසින් ගිවිසුම් ප්‍රකාරව නියමිත කාල වලදී එම මුදල් පියවා</td><td>• ගිවිසුමේ කොන්දේසි අනුව නීත්‍යානුකූල කටයුතු කිරීම සඳහා නීති අංශයේ උපදෙස් ලැබී ඇත.</td><td>මෙම රු.මි. 27.65 ක හිඟ ණය මුදලට අදාලව රු.650,000.00 ක මුදලක් අදාල සමිතිය විසින් 2025.03.06 දින ගෙවා ඇත. රු.මි. 27 ක ණය මුදලක් තවදුරටත් හිඟ ණය මුදල් ලෙස පවතී. සමිතිය අක්‍රිය මට්ටමේ පවතී.<br>• ගිවිසුම අනුව දෙපාර්තමේන්තුවට නඩු පැවරිය හැකිද යන්න නීති අංශයෙන් විමසා කටයුතු කරන බව පළාත් සමුපකාර කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.</td><td></td><td>ලේකම් ,<br>පළාත් සමුපකාර අමාත්‍යාංශය<br>පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්</td><td>05</td></tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නොමැති වීම හේතුවෙන් රු.මිලියන 27.65 ක ණය මුදලක් හිග ණය ලෙස පවතී. | | | | | |
| **පළාත් පාලන අමාත්‍යාංශය** | | | | | | |
| **<u>පළාත් පාලන දෙපාර්තමේන්තුව</u>** | | | | | | |
| 24 | පොළොන්නරුව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට අනුයුක්ත අංක NCKJ 3509 දරණ රථය 2020 අගෝස්තු 27 වන දින අනතුරකට ලක්වීම සහ මේ දක්වා අළුත්වැඩියා නොකිරිම.<br>මු.රෙ. 104(ප.මු.රී.54) වාර්තාව අනුව රක්ෂණ සමාගමෙන් අය නොවන කොටසෙන් සියයට 60ක් නිලධාරියාගෙන් සහ සියයට 40ක් රියදුරුගෙන් අයකළ යුතු බවට නිර්දේශ කර ඇත. එය මේ වන විට අය වෙමින් පවතී. | අළුත්වැඩියාවට අදාල ඇස්තමේන්තුව (රු.1,191,338.85) සඳහා පීපල්ස් ඉන්ෂුවරන්ස් හි executive Technical දර්ශණ ගුණරත්න මහතාගේ අනුමැතිය ලැබී ඇත. යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය මත අළුත්වැඩියාව අවසන් කර ඇත. රක්ෂණ සමාගම මගින් රු.1,325,907.00 ක් ගෙවා ඇත.<br>මෙම අය කිරීම් තීරණය කරන ලද්දේ වාහනය භාවිතයට ගත නොහැකි(condem) තත්වයේ ඇති ලෙස සළකා බවත්, එය අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි බව හඳුනාගෙන ඇති බැවින් නිලධාරීන්ගෙන් සිදු කරන අයකිරීම් සම්බන්ධයෙන් වන පරීක්ෂණ වාර්තාව නැවත සමාලෝචනය | නිලධාරීන්ගෙන් අයකිරීම ප්‍රගතිය -2025.12.12 දිනට<br>H.M.වින්දායා ප්‍රසාදිනී හේරත් මිය - ස.ප.පා.කොමසාරිස් (අයකල යුතු මුදල රු.466,800.00 ) 2025.12.12 දිනට අයකල මුදල රු. 163,380.00<br><br>චාමර සුරංග මයා - රියදුරු (අයකල යුතු මුදල . රු.311,200.00) 2025.12.12 දිනට අයකල රු.142,159.00<br>රථය අලුත්වැඩියාව අවසන් කර කාර්යාලය වෙත ගෙනැවිත් ඇත. එහෙත් තවදුරටත් පැවති දෝශ හේතුවෙන් නැවත ගරාජයට යොමු කර ඇත. | රක්ෂණ සමාගමෙන් බිල්පත සඳහා ගෙවා ඇතත් 2020 සිට මේ දක්වා රථය ධාවනයට යොදා ගැනීමට නොහැකිවීම හේතුවෙන් සිදු වී ඇති හානිය නිසාත්, නීත්‍යානුකූල නොවන ධාවනයකදී අනතුර සිදු වී ඇති නිසාත් නිලධාරීන්ගෙන් අයකිරීම නතර කිරීමට එකග නොවන බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>නීත්‍යානුකූල නොවන ධාවනයකදී අනතුර සිදු වී ඇත්නම් ඒ සඳහා වගකිව | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/පළාත් පාලන කොමසාරිස් | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | කිරීම සුදුසු බවත්, එය වාහනය අළුත්වැඩියා කර භාවිතයට ගත් පසු සිදු කරන ලෙසත් තීරණය කරන ලදී. | | යුතු නිලධාරීන්ට විනයානුකූල කටයුතු සිදුවිය යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. | | |
| 25 | 2014 වර්ෂයේ අනුරාධපුර මහ නගර සභාවේ රු. මිලියන 40 මුදල් වංචාව. | • මෙම මුදල් පළාත් සභා අරමුදලින් දරණ ලද වියදම් වන බැවින් මු .රෙ. 104 (ප.මූ.රී.54) පරීක්ෂණය පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කල යුතු බව දන්වන ලදී.<br>• රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ විමර්ශන ඒකකය මගින් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. | 1. මු.රෙ.104(ප.මූ.රී.54) පරීක්ෂණය ප්‍රධාන අමාත්‍යාංශය මගින් සිදු කර නොමැති බැවින් නව පළාත් පාලන අමාත්‍යාංශය මගින් සිදුකල යුතු බවට 2026.03.09 දින පැවති එම අමාත්‍යාංශ 2026 පළමු කාර්තුවේ විගණන කමිටුවේදී සාකච්ඡා විය.<br>2. අනුරාධපුර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් අද දින කමිටුව හමුවේ ප්‍රකාශ කරන ලද්දේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් මීට අදාලව පරීක්ෂණ පැවැත්වෙන බවත්, ඔවුන් භාරයේ මීට අදාල ලිපි ලේඛන පවතින බවත්ය. ඒ අනුව මු.රෙ.104 පරීක්ෂණයට අත්‍යාවශ්‍ය තොරතුරු ද ඔවුන් භාරයේ පවතින බැවින් එය සම්බන්ධීකරණය | 1. මෙම කරුණ දැනට වාර ගණනාවක් සාකච්ඡා කර ඇති බැවින් නිශ්චිත දිනවකවානු සහිතව පැහැදිලිව ප්‍රගතිය ප්‍රකාශ කල යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. (මෙම කාරණයට පමණක් නොව සියලු කාරණා සඳහා මෙය | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/පළාත් පාලන කොමසාරිස්/නාගරික කොමසාරිස් | 07 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | කිරීම වඩාත් සුදුසු බව ඔහු විසින් යෝජනා කරන ලදී. එසේම පළාත් පාලන ආයතනවල වැටුප් සම්බන්ධයෙන් අධීක්ෂණ ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙස ද ඔහු විසින් කමිටුව වෙත ඉල්ලීමක් කරන ලදී. | අදාල විය යුතු බවද දන්වන ලදී.) එසේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදු කරන පරීක්ෂණය, රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය මගින් සිදු කරන පරීක්ෂණය හා මු.රෙ.104(ප.මු.රී.54) පරීක්ෂණය යනු කාරණා තුනක් බවත් මෙම පරීක්ෂණ තුනම වෙන වෙනම ස්වාධීනව සිදු විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එසේම බාහිර ආයතනයකට ලිපි ගොණු භාර දෙන්නේ නම් භාර දෙන ලිපි ගොණුවේ අඩංගු සියළු ලිපි සහතික කර පිටපතක් කාර්යාලයේ තබාගත යුතු බවත්, | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | එපරිදි කටයුතු කර නොමැති නම් ඒ සඳහා ඊට අදාල නිලධාරීන් වගකිව යුතු බවත් දන්වන ලදී.<br>2. මීලග විගණන කමිටුව වන විට මු.රෙ.104 කමිටු පත්කර වාර්තා ලබාගත යුතු බව ද කමිටු සභාපති විසින් දන්වන ලදී.<br>3. ජොෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙය අලාභයක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොමැති බවය. එබැවින් මීලග විගණන වාර්තාවේ මතය දැක්වීමේදී මේ පිළිබඳ සලකා බැලීමට සිදුවන බව ද දන්වන ලදී. එසේම විගණන | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | හා කළමනාකරණ කමිටුවල මෙම කරුණ වාර 06 ක් දැනට කතා කර ඇති බැවින් එයද සඳහන් කිරීමට සිදුවන බව ද දන්වන ලදී.<br>4. මෙහිදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් payroll පරිගණක වැඩසටහන හරහා වංචා සිදුකල හැකි අවස්ථා පැහැදිලි කරමින් ඒවා වැලැක්වීම සඳහා පාලන ක්‍රමවේද පවතින බවද එම පාලන ක්‍රම පිළිබඳ නොසැළකිල්ලෙන් කටයුතු කල හොත් මිස වංචාවන් සිදු කල නොහැකි බව ද ප්‍රකාශ | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | කරන ලදී. ඒ අනුව<br>i.වැටුප් පාලන ගිණුම පවත්වාගෙන යාම මගින් මාසිකව කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ වෙනස්වීම් (ස්ථානමාරුවී යම් හා ර්ම), නිලධාරීන්ගේ වැටුප් වෙනස්වීම් සිදුවන වැටුප් අඩුවැඩිවීම් හඳුනා ගැනීමට හැකි වීම.<br>Ii. වැටුපෙන් සිදුකරන අවකරණ හෝ මාසයේ වැටුපෙන් කොටසක් බැංකු ගත කිරීම සිදු කිරීමේදී ශේෂ වැටුප යොමු කරන බැංකු ගිණුම හැර වෙනත් ගිණුම් දෙකක් සඳහා පමණක් | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | වැටුපෙන් කොටසක් යැවීමට ඉඩ දීම.<br>Iii.මාස 03 කට වරක් බැංකුවේ pay slip ගෙන්වා ගෙන ආයතනයේ pay slip සමග පරීක්ෂා කර ඉලෙක්ට්‍රොනික් වංචාවක් සිදුවන්නේද යන්න පරීක්ෂා කර බැලීම.<br>iv. වැටුපේ සිදුවන සියළුම වෙනස්වීම්වලට අදාලව ලේඛණයක් පවත්වා ගැනීම හා සියළු වෙනස් වීම් ගණකාධිකාරී මගින් අනුමත කරවා ගැනීම.<br>V. payroll පරිගණක වැඩසටහනේ මුරපද මාස 03 කට වරක් මාරු කිරීම හා පළමු මුරපදය ගණකාධිකාරී | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | භාරයේද, දෙවන මුරපදය අධීක්ෂණ නිලධාරියෙකු භාරයේද, තුන්වන මුරපදය විෂය නිලධාරී භාරයේද පවත්වාගෙන යාම. මෙම පාලන ක්‍රමවේද අනුගමනය කිරීමෙන් වැටුප් වංචා සිදුවීම වලක්වා ගත හැකි බව ඔහු විසින් පෙන්වා දෙන ලදී. | | |
| 26 | තලාව ප්‍රාදේශිය සභාවේ කැබ්රථය අනතුරට ලක් වී වසර 05ක් පමණ වන අතර එහි ඇස්තමේන්තු ගත මිලියන 4.4 ක අලාභය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වගකිවයුත්තන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කල යුතු බවත්, තවදුරටත් ප්‍රමාද නොකර වාහනය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවත් කමිටුව විසින් දන්වන ලදී. මු.රෙ. 104 (ප.මූ.රී.54) පරීක්ෂණය නිර්දේශ අනුව රියදුරු වෙතින් 10% ක්ද, | අල්ලස් හා දූෂණ විර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කර ඇත. | මෙම කරුණ පළාත් පාලන දෙපාර්තමේන්තු විගණන කමිටුවට යොමු කිරීමට තීරණය විය. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/පළාත් පාලන කොමසාරිස් | 07 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | සභාපති වෙතින් 90% ක් ද අයකිරීමට යෝජනා කර ඇත. රියදුරුගෙන් අයවිය යුතු මුදල අයකර ඇත. සභාපති රජයේ නිලධාරියෙකු නොවන බැවින් ඔහුගෙන් අයවිය යුතු කොටස අයකර ගැනීමට අනුරාධපුර දිසා අධිකරණයේ නඩු පවරා ඇති නමුත් සභාපති උසාවිය හමුවේ පෙනී සිට නොමැත. පොදු දේපල පනත යටතේ නඩු පැවරීමට දෙපාර්තමේන්තු විගණන කමිටුවේදී තීරණය කර ඇත. | | | | |
| 27 | පොළොන්නරුව මහ නගර සභාව විසින් ඉදිකරන ලද කදුරුවෙල නව වෙළෙඳ සංකීර්ණය<br>• වෙළඳ සංකීරණය වසර 30 ක කාලයක් සඳහා තනි පුද්ගලයෙකුට බදු දීම<br>• ලබාගත යුතු එක්වන් මුදල රු. මිලියන 5 සිට රු. මිලියන 3 දක්වා අඩු කර ලබා ගැනීම | පරීක්ෂණ වාර්තාව ලබා දී ඇත. පරීක්ෂණ කමිටු නිර්දේශ නොපමාව ක්‍රියාත්මක කරන ලෙස දන්වන ලදී. | පරීක්ෂණ කමිටු නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නැත. වාර්තාව 2025.12.30 දින ප්‍රධාන අමාත්‍යාංශයට ලබා දී ඇත.<br><br>පරීක්ෂණ කමිටු වාර්තාවේ නිර්දේශවල විගණනය පෙන්වා දී ඇති කරුණු සම්බන්ධ නිර්දේශ ඇතුලත් කර නොමැති බවත්, කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට පමණක් නිර්දේශ කර ඇති බව ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. | පරීක්ෂණ වාර්තාව නව අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසත්, නව අමාත්‍යාංශය මගින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් දන්වන ලදී. දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ විගණන කමිටුවලදී මේ පිළිබද සාකච්ජා කර අවශ්‍ය | පළාත් පාලන කොමසාරිස් | 06 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | • බදුකරුගෙන් ලබාගත් එක්වන් මුදලෙන් 50% ක් ගොඩනැගිල්ල ඉදිකල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම.<br>• මාසික කුලී අය කර නොගැනීම.<br>ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාව පදනම් කරගෙන මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AD/09/01/PO/2025(01) හා 2025.04.22 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂ(පුහුණු) ජේ.රලියුදීන් මහතා පත් කර ඇත. | | | පියවර නොගැනීම පිළිබඳව කමිටුවේ අප්‍රසාදය පල විය. | | |
| 28 | <u>අනුරාධපුර මහා නගර සභාව</u><br>1. අනුරාධපුර මහා නගර සභාවට අයත් බැංකු පෙදෙස අංක 07 දරණ නිල නිවස සමූපකාර රෝහල සඳහා ලබාදීම වෙනුවෙන් 2022 අගෝස්තු 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.6,719,842 කි. ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට 2022 නොවැම්බර් 04 දින එවකට වැඩබලන නගරාධිපති එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මහතා විසින් | මෙම දේපල අනුරාධපුර මහ නගර සභාවට අයත් දේපලක් වන අතර, 1973 වර්ෂයේ පමණ සිට අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය භුක්ති විඳිමින් සිටින බවත්, මේ සම්බන්ධයෙන් හිටපු ගරු ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡා කල බවත් එහිදී නිලධාරීන්ට මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකියාවක් නොමැති බවත්, මහ නගර සභාවට මහජන | 1. අනුරාධපුර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලද්දේ අනුරාධපුර මහා නගර සභාවට අයත් බැංකු පෙදෙස අංක 07 දරණ නිල නිවස සමූපකාර රෝහල සඳහා ලබාදීම වෙනුවෙන් අනුරාධපුර මාකට් පෙදෙසේ පිහිටි සමූපකාර සංවර්ධන කොමසාරිස් සතු ඉඩමක් හුවමාරු කර ගැනීමට යෝජනා වී සාකච්ඡා කර ඇති බව ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින්ද කරුණු දක්වමින් තහවුරු කරන ලදී. | 1. අය කිරීම් ප්‍රගතිය නිශ්චිතව දැක්විය යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී.<br>2. මෙම හුවමාරුව සම්බන්ධයෙන් සභා තීරණයක් ගන්නා | ලේකම්, පළාත් පා. අමා./ ලේකම්, පළාත් සමූ. අමා./ පළාත් පාලන කොමසාරිස්/නාගරික කොම./ ප.සමූ.කොම. | 03 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පිළිතුරු ලබාදී ඇති නමුත් ඒ සම්බන්ධව ඉන්පසු කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම.<br><br>2. මාර්කට් පෙදෙස කඩ කාමර 13 කට අදාළව අයවිය යුතු හිඟ ශේෂය රු.4,846,526 කි. එයින් කඩ අංක 43 ට අදාළව හිඟ මුදල වන රු.2,001,695 ක් වසර 10 කට ආසන්න කාලයක් තුළ ගෙවා නොතිබීම(ඩී.එස්.එස්.සුමිත්‍රාරච්චි මහතා විසින් එම කඩය පවත්වාගෙන යනු ලබයි)<br>3. මහා නගර සභාවේ අභ්‍යන්තර විගණනය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකර නොතිබීම.<br><br>4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7 (1) | නියෝජිතයින් පත් වූ පසු මහ සභාවට යෝජනාවක් ඉදිරිපත් කර මේ සම්බන්ධයෙන් තීරණ ගත යුතු බවට තීරණයක් ගත් බවත් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී අදාල යෝජනාව සමූපකාර සංවර්ධන කොමසාරිස් මගින් ඉදිරිපත්විය යුතු බවත්, ඒ සමගම මාකට් පෙදෙසේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සතු ඉඩමක් වටිනාකම් නොසලකා හුවමාරු කර ගැනීම මෙහිදී සිදු වන බවත්, අනුරාධපුර මහනගර සභාව වෙත ගෙවිය යුතු හිඟ මුදල කපා හැරීම සදහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුවක් ලබාගෙන ඇති බවත්, වසරකට මිලියනයකට ආසන්න මුදලක් හිග බදු ලෙස පවතින බවත්, එම මුදල කපා හැරීමට අනුරාධපුර මහ නගර සභාව එකග විය යුතු වන බවත් පළාත් පාලන කොමසාරිස් විසින් මෙහිදී ප්‍රකාශ කරන ලදී. | 2. හිග කඩකුලී අයකර ගැනීමට කටයුතු කර ඇති බවත්, මේ වන විට හිග මුදලින් 60%, 70% ක් පමණ අයකර ගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී.<br>3.මහා නගර සභාවේ අභ්‍යන්තර විගණනය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කල යුතු බවට අදහස් කරන ලද්දේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් විසින් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කල යුතු බව යන්න ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඉදිරියේදී කටයුතු කරන බව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.<br>4.මහා නගර සභාවේ තොරතුරු ලබා ගැනීමේදී ඊට යම් බාධා පැවතීම සම්බන්ධයෙන් ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති විසින් පැහැදිලි කල අතර, දෛනික ධාවන සටහන් විගණනය වෙත නොලැබීම පිළිබද ප්‍රකාශ කරමින් මහ නගර සභාවේ වාහන සදහා ඉන්ධන නිකුත් කිරීමද ගැටළු සහගත බව දන්වන ලදී. එසේම තොරතුරු ලබා දීමේ ප්‍රමාදය තවදුරටත් පවතින බව ද ප්‍රකාශ කරන ලදී. මෙහිදී නාගරික කොමසාරිස් විසින් වාහනවලට ඉන්ධන නිකුත් කිරීමේ නව | ලෙසත් ඉඩම් දෙකෙහි වටිනාකම් පිළිබදව හා කුලිය පිළිබදව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුවක් ලබා ගත යුතු බවද දන්වන ලදී.<br>3. මීලග විගණන කමිටුවට පෙර තීරණයක් ගෙන ඒ පිළිබද ප්‍රගතිය මීලග විගණන කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.<br>අදාල අමාත්‍යාංශ දෙකෙහි ලේකම්වරුන්ට මේ සම්බන්ධයෙන් මැදිහත්වන ලෙස ද දන්වන ලදී.<br>4. මහා නගර සභාවේ අභ්‍යන්තර විගණනය | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කොටස මඟින් ලබාදී ඇති බලතල ප්‍රකාරව විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරිය ලත් ඕනෑම තැනැත්තෙකුට විගණිත ආයතනයේ පොත්පත්, වාර්තා, ලේඛන ලබාදීමට සහ ඕනෑම තැනැත්තෙකුගෙන් ලිඛිත හෝ වාචික ප්‍රකාශ ලබා ගැනීමට හැකි නමුත් අනුරාධපුර මහා නගර සභාවේ තොරතුරු ලබා ගැනීමේදී ඊට යම් බාධා පැවතීම.<br><br>5. මහ නගර සභාවට අයත් වාහනවල ධාවන සටහන් කිසිවක් ඉදිරිපත් කර නොමැතිවීම. | මේ සම්බන්ධයෙන් අනුරාධපුර මහ නගර සභාව මගින් තීරණ ගත යුතු බවත් මෙම විගණන කමිටුව සඳහා අනුරාධපුර මහ නගර සභාවේ නියෝජනයක් සිදු නොවන බවත් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>මහ නගර සභා ආඥා පනත අනුව මහ නගර සභාව විගණනය කිරීමේ බලය විගණකාධිපති දෙපාර්තමේන්තුවට පමණක් සිදුකල හැකි බවත්, ඒ සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බවත් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු විගණන කමිටුවේදී සාකච්ජා වූ බවත් නාගරික කොමසාරිස්වරයාට මේ සම්බන්ධයෙන් මැදිහත්වන ලෙස | ක්‍රමවේදයක් හඳුන්වා දුන් බවත්, ඒ අනුව මහ නගර සභාවේ වාහනයකට ඉන්ධන ලබා ගැනීමේදී එම සභාවේ නිලධාරියෙකු හා විගණන නිලධාරියෙකු අතර ඇති වූ ගැටළුමයකාරී තත්වයක් වාර්තා වූ බවත්, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සාකච්ජා කර විගණනයට අවශ්‍ය තොරතුරු නොපමාව ලබා දෙන ක්‍රමවේදයක් සකස් කරන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම විගණනය විසින් තොරතුරු ඉල්ලීමේදී නාගරික කොමසාරිස් දැනුවත් කරන ලෙසද විගණනයෙන් ඉල්ලා සිටින ලදී. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් මගින් සිදු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කල යුතු බව දන්වන ලදී.<br>5. විගණනයට තොරතුරු ලබාදීම සඳහා අංශ අනුව බලය පවරා තොරතුරු කඩිනමින් ලබා දිය යුතු බව දන්වන ලදී. | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දැනුම් දුන් බවත් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.<br>මේ සම්බන්ධයෙන් නාගරික කොමසාරිස්වරයාගේ අවධානයට යොමු කරන බව පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.<br>• මීලග විගණන කමිටුව සදහා මහ නගර සභාවේ නිලධාරීන් කැදවිය යුතු බව තීරණය විය. | | | | |
| 29 | 01. අනුරාධපුර මහා නගර සභාවේ නීති නිලධාරි ඩී.එන්.ප්‍රියන්ති මිය පළාත් පාලන කොමසාරිස් විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවට ස්ථානමාරු කර ඇති අතර ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන වැටුප් ප්‍රතිපූරණය නතර කර ඇත. මූලික පරීක්ෂණයක් සිදුනොකර ස්ථානමාරු කිරීම නිසා නීති නිලධාරි විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම නිසා නගර සභා අරමුදලින් වැටුප් | මීලග විගණන කමිටුව සදහා මහ නගර සභාවේ නිලධාරීන් කැදවිය යුතු බව තීරණය විය. | මහ නගර සභාව සදහා නීති නිලධාරිගේ සේවය ලබා ගන්නා බැවින් මහ නගර සභාව මගින් වැටුප් ගෙවන බවත්, එය පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපූරණය නොකරන බවත් නාගරික කොමසාරිස් විසින් දන්වන ලදී. එසේම නීති නිලධාරී ස්ථාන මාරු කිරීමට හේතුව සදහන් නොවන බැවින් නිදහස් කිරීම සිදු නොකර ඇති බවද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන ඒකකය මගින් සිදු කරන ලද විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙස මෙම ස්ථාන මාරුව ලබා දී ඇති බවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් වැටුප් | 1. මූලික විමර්ශනයේ නිර්දේශ ලබා දෙන තෙක් වැටුප් ගෙවිය යුතු බව ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>පොළොන්නරුව මහ නගර සභාවේ නීති නිලධාරී සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා | ලේකම්, පළාත් පා. අමා./පළාත් පාලන කොමසාරිස්,/ නාගරික කොම.අ/පුර, පො/නරුව | 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගෙවීමට සහා අනුමැතියක් ලබාගෙන වැටුප් ගෙවනු ලබයි.<br>02. ගිනි තබා විනාශ කිරීමට ලක්වූ කීරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ අංක PD – 120 එක්ස්කැවේටර් යන්ත්‍රය සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව අනුව නාගරික කොමසාරිස්, ඉංජිනේරු, ගණකාධිකාරි, පරිපාලන නිලධාරි සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක යන නිලධාරීන්ගෙන් සමානුපාතිකව අයකළ යුතු බවට තීරණය කර ඇත. යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ තක්සේරු වාර්තාව අනුව සිදුවී ඇති අලාභය වන රු.මිලියන 3.3 න් ¼ ක වටිනාකමක් වූ රු.825,000 ක් සමානුපාතිකව එක් අයෙකුගෙන් රු.165,000 බැගින් අයකිරීමට තීරණය කර ඇත. 2025 ඔක්තෝබර් 31 දින එක් එක් නිලධාරීන්ට ලිපි යවා ඇති අතර මේ වන තෙක් අලාභය අයකිරීම පිළිබඳව කිසිඳු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | | ප්‍රතිපූරණය අත්හිටුවා ඇති බව ජොෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී. එසේම මේ සමබන්ධයෙන් නඩුවක් පවතින බවත්, පරීක්ෂණයක ප්‍රතිපලයක් ලෙස ස්ථාන මාරුව ලබා දී ඇති බව අධිකරණයට වාර්තා වී නැති බවත් ඇය විසින් ප්‍රකාශ කල අතර, එම නීති නිලධාරිණියට හිටපු ප්‍රධාන ලේකම්වරයෙකු විසින් privaet practice කිරීමට (පෞද්ගලික නීති සේවයේයෙදීමට) අවසර ලබා දී ඇති බවත්, ඊට අදාලව රජයට 25% ක් ගෙවිය යුතු බව දක්වා ඇතත් එම මුදල ඇය විසින් නොගෙවීමද මෙම ස්ථාන මාරුව ලබා දීමට එක් හේතුවක් වන නමුත් එම කරුණු අධිකරණයට වාර්තා වී නැති බව ද ඇය විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති අංශයේ නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම නඩුවේ මූලික විරෝධතා විමසීම දැනට සිදු වෙමින් පවතින බවත්, අධිකරණය විසින් වැටුප් ප්‍රතිපූරණය නොකිරීම වරදක් බව සඳහන් කරන බවය.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුල නීති නිලධාරී තනතුරක් නොමැති වුවත් පොළොන්නරුව මහ නගර සභාවේ නීති නිලධාරී සතියට දින කිහිපයක් පලාත් පාලන | ලෙස පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී.<br>2. ගිනි තබා විනාශ කිරීමට ලක්වූ අංක PD – 120 එක්ස්කැවේටර් යන්ත්‍රය සම්බන්ධයෙන් වගකිව යුතු බවට නිර්දේශ කර ඇති නිලධාරීන් දැනට සේවය කරන ආයතනවල ආයතන ප්‍රධානීන් වෙත දන්වා වැටුපෙන් අය කර ගැනීම් සිදු කරන ලෙස දන්වන ලදී. | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඇය විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී ලෙස රබර් මුද්‍රාවක් ද භාවිතා කරන බවත් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කල අතර, මෙයද ඉදිරියේදී ගැටළුවක් විය හැකි බව සඳහන් කරන ලදී.<br>ගිනි තබා විනාශ කිරීමට ලක්වූ අංක PD – 120 එක්ස්කැවේටර් යන්ත්‍රය සම්බන්ධ මූලික විමර්ශන වාර්තාව අනුව අදාල නිලධාරීන්ට ගෙවීම් කරන ලෙස දන්වා ඇතත් මෙතෙක් ගෙවා නොමැති බවත්, එක් අයෙකු පමණක් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, නගර සභාවේ සේවය කරන අයගේ වැටුපෙන් අය කිරීම් සිදු කරන බවත් නාගරික කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| | **සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සිය** | | | | | |
| 30 | 2020.05.28 දින සේවය අවසන් කරන ලද ගණකාධිකාරී දිලීප පුෂ්ප සාගර මහතා නිළ නිවාසයෙන් ඉවත් නොවීම.<br>ඉඩමේ අයිතිය සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සිය සතුව නොමැති බැවින් සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා ලෙස ම.නු.ප. ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති | | මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව ක්‍රියාත්මක වෙමින් පවතින බවත් දැනට නඩු වාර දෙකක් ක්‍රියාත්මක වූ බවත්, මෙම නිල නිවස සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සිය සතු බව දිලීප පුෂ්ප සාගර මහතා නොදන්නා බව පවසා අධිකරණය නොමග යැවීමට උත්සාහ දරණ බව සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී. එහෙත් ගොඩනැගිල්ල | මෙහි ප්‍රගතිය විමසීමට අමාත්‍යාංශ විගණන කමිටුවට යොමු කිරීමට තීරණය විය. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/සභාපති, සං.නි.හා යන්.ඒජන්සිය | 14 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | බව සං. නිර්. සහ යන්. ඒජ. සභාපති විසින් ප්‍රකාශ කරන ලදි. | | සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සිය සතු බවට සනාථ කිරීම සඳහා සාක්ෂි තිබෙන බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 31 | **ගල්රෝල එන්ජිම අස්ථානගතවීම**<br>ගල් රෝලට අදාල ලිපි ගොනුව පෙර පත් කරන ලද කමිටුවේ සභාපති භාරයේ තිබී හමුවූ බවත්, දැනට ඒ සඳහා නව කමිටුවක් පත් කර ඇති බවත්, වාර්තාව සති 02 ක් ඇතුලත ලබා ගත හැකි බවත් සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>නව කමිටුව,<br>A.B. වන්නිනායක මයා.සාමාන්‍යාධිකාරී<br>G.M.මැදහීන්නෙගෙදර මයා,ගණකාධිකාරී<br>W.T.M.L.C.ජයසිංහ මයා,යාන්ත්‍රික ඉංජිනේරු<br>P.R.K.ජයවර්ධන මිය. පරිපාලන නිලධාරි | මූලික විමර්ශන වාර්තාව අනුව ගල්රෝල අපහරණය කිරීමට නිර්දේශ කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ගල්රෝල අපහරණය කිරීමට ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NCP/CM/FD/12/විගණන කමිටු/2025 හා 2025.11.12 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකගතාවය පල කර ඇත. | රු.913,320.00 ක වටිනාකමක් යටතේ ගල්රෝල අපහරණය කර ඇති බව සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී. | රු.913,320.00 ක වටිනාකමට අදාල රිසිට්පත ඉදිරිපත් කරන ලෙසත් ඉන් පසු මෙම කරුණ ඉවත් කල හැකි බවත් දන්වන ලදී. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/ සභාපති,සං.නි.හා යන්.ඒජන්සිය | 14 |
| | | | | | | |
| 32 | <u>**අත්තිකාරම් නොපියවීම**</u><br>උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් සං: නි: හා යන්: ඒජ: වෙත වැව් 63ක් ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව රු. 69,731,617.29 ක අත්තිකාරම් මුදලක් | I. මෙ සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ගයකට යා යුතු බව කමිටුව විසින් තීරණය කරන ලදී. (ලිපිගොනු අතුරුදන්වීම | හිග අත්තිකාරම් මුදලින් 2025 ඔක්තෝබර් දක්වා ගෙවා ඇති මුදල රු.500,000.00. තවදුරටත් ගෙවිය යුතු මුදල -රු.25,905,862.00<br>සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලද්දේ | සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ප්‍රගති වාර්තාව මෙම ව්‍යාපෘතිය අවසන්වීමට මාස දෙකකට පමණ පෙර තිබූ | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්/ සභාපති,සං.නි.හා යන්.ඒජන්සිය | 12 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නිකුත් කොට තිබුණි. එකී අත්තිකාරම් මුදලින් රු 38,481,079.29 ක් ප්‍රධාන අමාත්‍යාංශය වෙත පියවීම් කොට ඇති බවත් 2020 වර්ෂයේදී පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගන්නා ලද රු 4,844,676.00 ක් පියවා ගැනීමෙන් අනතුරුව ප්‍රධාන අමාත්‍යාංශය වෙත තව දුරටත් රු 26,405,862.00 ක මුදලක් නොපියවන ලද අත්තිකාරම් ලෙස පවතී.<br><br>මාසයකට රු.100,000.00 බැගින් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ගෙවීමට 2025.06.06 දින සිට ආරම්භ කරන බව ඒජන්සියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී. මිලියන 26 ක මුදලින් මසකට රු.100,000.00 ක් බැගින් ගෙවීම ප්‍රමාණවත් නොවන බව කමිටුව විසින් ප්‍රකාශ කල අතර, ආයතනයේ පවතින මූල්‍ය අර්බුදය හමුවේ එයට වැඩි මුදලක් ගෙවීමට හැකියාව නොමැති බව එම ආයතනයේ සභාපති විසින් ප්‍රකාශ කරන ලද අතර, ඉදිරියේදී ආයතනය ශක්තිමත්වන ආකාරය අනුව | සම්බන්ධයෙන් පළමු ක්‍රියාමාර්ගය ගැනීම)<br>හිඟ අත්තිකාරම් මුදල ද වාරික වශයෙන් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු බවද දන්වන ලදී. | පසුගිය දිනවල එම ආයතනයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැමිණි බවත් එහි ප්‍රතිඵලයක් ලෙස හමුවූ DECMA ආයතනයට අයත් ලිපිගොණුවක් පරීක්ෂා කිරීමේදී එහි ඇතුලත්ව තිබූ ප්‍රගති වාර්තාවක් හමුවූ බවත් එය ප්‍රධාන අමාත්‍යාංශය මගින් සකස් කරන ලද්දක් බවත්, එම වාර්තාව අනුව DECMA ආයතනය විසින් ප්‍රධාන අමාත්‍යාංශයට නොව ප්‍රධාන අමාත්‍යාංශය මගින් DECMA ආයතනය වෙත මිලියන 28 ක මුදලක් ගෙවීම් කල යුතුව ඇති බව ද දීර්ඝ ලෙස කරුණු පැහැදිලි කරමින් ප්‍රකාශ කරන ලදී.<br>එසේම මෙයට අදාලව අවසන් ගිණුම් සකස් කර නොමැති බවත්, එබැවින් මෙම ප්‍රගති වාර්තාව පදනම් කරගෙන අවසන් ගිණුමක්ද සකස් කල බවත් ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. එබැවින් DECMA ආයතනය විසින් දැනට ගෙවීම් කරන මුදල නවතා දැමීමට අනුමැතියක් ලබා දෙන ලෙසත් මෙතෙක් ගෙවා ඇති මුදල ආපසු ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. | ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තාවක් බවත් එහි කිසිම ස්ථානයක ප්‍රමාණපත්‍ර අනුව ප්‍රගතියක් ඇතුලත්ව නැති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) විසින් ප්‍රකාශ කල අතර, මෙය නැවත විමර්ශනයක් සඳහා යොමු කල යුතු බව ද ප්‍රකාශ කරන ලදී.<br>මේ සම්බන්ධයෙන් විසඳුමක් ලැබෙන තෙක් දැනට මාසිකව ගෙවනු ලබන රු.100,000.00 ක මුදල තවදුරටත් ගෙවන ලෙසත්, අවසන් ගිණුම ද සමග ප්‍රධාන අමාත්‍යාංශය මගින් පත් කරන කමිටුවක් මගින් පරීක්ෂණයක් සිදු කල යුතු බවත් තීරණය විය. | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වැඩි මුදලක් ගෙවීමට සළකා බලන බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | | | | | |
| 33 | ආයතන භූමියෙහි පහත විස්තර සඳහන් වාහන 18 ක් වර්ෂ ගණනාවක් තිස්සේ වැස්සට අව්වට නිරාවරණය වෙමින් පැවතීම.<br>වාහන අංකය ලියාපදිංචි අයිතිකරු<br>36-9468 කෘෂි.දෙපා. කොළඹ<br>24-7526 කෘෂි.දෙපා.පේරාදෙණිය<br>32-1144පළාත් සමාජ සේ.දෙ. කොළඹ<br>31-1938 ප්‍ර.ලේකම්,උ.මැ.ප.<br>53-1469 පළාත් අධ්‍යා.දෙ.<br>13-3400 ක්‍රීඩා අමාත්‍යං.කොළඹ<br>11-8150 UNDP කොළඹ<br>31-6753 දි.ලේකම්, අ.පුර<br>26-0753 වාරිමාර්ග දෙපා. කොළඹ<br>17-6156 අධ්‍යා. දෙපා.උ.මැප.<br>31-6737 පළාත් පා.දෙපා.<br>50-6131 කෘෂි.දෙපා. කොළඹ<br>31-3574 සැළසුම් ක්‍රි.අමාත්‍ය.කොළඹ<br>31-5541 කෘෂි.දෙපා.පේරාදෙණිය<br>54-7305 සැළසුම් ක්‍රි.අමාත්‍ය.කොළඹ<br>32-1880 ප්‍රධාන අමාත්‍යං.උ.මැප. | මේවා ධාවනයට යොදා ගත නොහැකි පැරණි වාහන බැවින් ඉදිරියේදී වෙන්දේසිය සඳහා ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.<br>පළමුව උතුරු මැද පළාත් සභාවට අයත් වාහන සම්බන්ධයෙන් අපහරණ කටයුතු කල යුතු බවත්, අනෙකුත් වාහන ප්‍රධාන ලේකම් නමින් පවරා ගැනීමට කටයුතු සිදුකරන ලෙසත් කමිටුව උපදෙස් දෙන ලදී. | • 53-1469 - අපහරණය කර ඇත.<br>• 17-6156 , 31-6737, 32-1880 යන වාහන 2025/26 ප්‍රධාන ලේකම් කාර්යාලයේ අපහරණ කමිටුවට යොමු කර ඇත.<br>• 26-0753, 50-6131, 31-5541 ප්‍රධාන ලේකම්, උ.මැ.ප. වෙත පවරා ගැනීමට MTA 16 අත්සන් කර ඇත.<br>• 31-6753 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2024.08.26 දින වෙන්දේසියේදී තලංගම උතුර අංක 616/2 ලිපිනයේ පී.පී.ඩබ්.කුමාර මයා වෙත අබලි ලෙස විකුනා ඇත. ඔහු විසින් රු.30000.00 ක තැන්පත් මුදලක් ගෙවා ඇත. වාහනය මෙතෙක් ඉවත් කර ගෙන නැත.අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් 2026.02.14 දිනැති ලිපිය මගින් වාහනය ඉවත් කර ගන්නා ලෙසත්, ඉවත් කර නොගත හොත් තැන්පත් මුදල රජයේ ආදායමට ගන්නා බවත් දන්වා ඇත. | මෙම වාහන සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) වෙත වගකීම පැවරීමට තීරණය විය. | නි.ප්‍ර.ලේ(පාලන) /සභාපති,සං.නි. හා යන්.ඒජන්සිය | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 50-4584 රාජ්‍ය සැප.දෙපා. කොළඹ<br>32-0946 දි.ලේකම්,රත්නපුර | | | | | |
| පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | | | | | | |
| | **<u>පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව</u>** | | | | | |
| 34 | **දීර්ඝ කාලීන බදු ඔප්පු සෑදීමේ ප්‍රමාදයක් පැවතීම.** බදු ගොනු 1369 ක් පවතින බවත්, ඒ අතුරින් ගොනු 995 ක් ඉඩම් කොමසාරිස් ජනරාල් භාරයේද, ගොනු 339 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේද, ගොනු 35 ක් තක්සේරු දෙපාර්තමේන්තුවේද පවතින බව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | දීර්ඝ කාලීන බදු ඔප්පු සෑදීම ප්‍රමාද වීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මිනින්දෝරු හා තක්සේරු දෙපාර්තමේන්තු වල ප්‍රමාදය බව ඉඩම් කොමසාරිස් විසින් විගණන හා කළමනාකරණ කමිටුව වෙත කරුණු පැහැදිලි කරන ලදී. | | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පැවැත්වෙන විගණන කමිටුවේදී මෙම ප්‍රමාදය සම්බන්ධයෙන් විමසිය හැකි බැවින් ඊට අදාල තොරතුරු කාලරාමුවක්ද සහිතව ලබාදෙන ලෙස කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. | ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය/ පළාත් ඉඩම් කොමසාරිස්. | 07 |
| **පළාත් අමාත්‍යංශයක් යටතට නොගැනෙන ආයතන** | | | | | | |
| | **<u>පළාත් සැළසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව</u>** | | | | | |
| 35 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් උතුරු මැද පළාත සඳහා 2018 | දැනට මෙය භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින බව පළාත් සැළසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) විසින් ප්‍රකාශ කරන | විමර්ශන වාර්තා මෙතෙක් ලැබී නැත. | | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, (පාලන) | 11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට දස අවුරුදු තිරසර ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම.<br>• මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු. 27,606,176.00 කි. මෙම ව්‍යාපෘතියේ පළාත් ආදායම් හා පළාත් පාලනයට අදාල කොටස ක්‍රියාත්මක වේ.<br>රු. 9,000.000.00 ක් අගය වන "ගම" නැමැති ග්‍රන්ථය සහ ඊට අදාල වැඩසටහන් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට හා එය ක්‍රියාත්මක කිරීමට උපයෝගී කරගෙන තිබූ බවට සාක්ෂි නොතිබීම. | ලදී. මෙහිදී පුද්ගලික මට්ටමින් කටයුතු කර ඇති බවත්, කථිකාචාර්යවරුන්ගේ පුද්ගලික ගිණුම්වලට මුදල් බැර කර ඇති බවත්, මීට අදාලව කටයුතු කරන ලද නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කල යුතු බවත් නියෝජ්‍ය විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>මේ සඳහා පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට කමිටුව විසින් තීරණය කරන ලදී.<br>ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CS/ED/15/3/2 හා 2025.06.11 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය යටතේ වන විමර්ශන ඒකකය මගින් විමර්ශන සිදු කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ ලේකම් වෙත දන්වා ඇත. | | | | |
| | **පළාත් පුහුණු ඒකකය** | | | | | |
| 36 | **කොරකහවැව පුහුණු මධ්‍යස්ථානය පළාත් පුහුණු ඒකකය වෙත භාර දීම**<br><br>අතරුදවුම් මුදල රු. 14,263,982.27<br>ගොඩනැගිල්ල භාරගැනීමට කමිටුවක් පත් කර තිබුණද උපකරණ නිශ්චිතව හඳුනා ගැනීමේ අපහසුව නිසාත් තාක්ෂණික දැනුම ඇති පුද්ගලයෙකු කමිටුවෙහි නොමැති නිසාත් | දැනට නිලධාරීන් වෙනස් වී ඇති බවත්, ශ්‍රවනාගාරය පළමුව භාර ගැනීමට එකග වී ඇති බවත්, නි.ප්‍ර.ලේ(ඉංජි)වැ.බ. විසින් ප්‍රකාශ කරන ලදී.<br>මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) සමග ගරු ආණ්ඩුකාරතුමා හමුවී සාකච්ජා කල බවත්, එහිදී 4 වන අදියරේ | මෙම ගොඩනැගිල්ල තවදුරටත් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව භාරයේ පවතී. 2025.12.31 දින වන විට 4 වන අදියරේ පවතින සුළු වැඩ ප්‍රමාණය අවසන් කර ඇත. කොන්ත්‍රාත්කරු ගොඩනැගිල්ලෙන් ඉවත්ව ඇත. | මෙය ඉදිරියේදී උපයෝජනය කරන ආකාරය සම්බන්ධයෙන් විවිධ සාකච්ජා පවත්වා ඇතත් මෙතෙක් තීරණයක් ගෙන නොමැති බව සාකච්ජා විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පුහුණු)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජි.) | 07 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගොඩනැගිල්ල හා උපාංග භාර ගැනීම කමිටුව විසින් ප්‍රතික්ෂේප කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පුහුණු) විසින් දන්වා සිටින ලදී. | පවතින සුළු වැඩ ප්‍රමාණයක් මාස 03 ක පමණ කාලයක් තුල අවසන් කර සියලුම ලිපිගොනු (Drowing) සමග ගොඩනැගිල්ල භාරදීමට කොන්ත්‍රාත්කරු එකග වූ බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්) ප්‍රකාශ කරන ලදී. එම වැඩ අවසන් වූ පසු කමිටුවක් මගින් උපකරණ සමග ගොඩනැගිල්ල භාර ගැනීමට පියවර ගන්නා බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | ඉදිරියේදී උපයෝජනය කරන ආකාරය සම්බන්ධයෙන් මෙතෙක් තීරණයක් ගෙන නැත. ශ්‍රවනාගාරය භාවිතයට ගනිමින් පවතී. එක් කොටසක ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයක් පවත්වාගෙන යනු ලබයි. | | | |
| 37 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් නඩු සම්බන්ධ තොරතුරු | | | | | |
| | අනු අංකය \| නඩු අංකය ----------<br>01 \| SCFR 224/2024 ගරු මහාධිකරණය \| **ප්‍රමිතියෙන් තොර ආහාර නිෂ්පාදනය සම්බන්ධව** මරදන්කඩවල, උලාන්කුලම, Ulankulama Dairies (Private) Limited ආයතනයෙහි හා එම ලිපිනයෙහි සී.ඒ.එච්.එම්.අයි.ජේ. චන්ද්‍රසේකර යන පැමිණිලිකරු විසින් 11 වන වගඋත්තරකරු වශයෙන් උතුරු මැද | මෙම නඩුවලට අදාල වර්ථමාන ප්‍රගතිය ජාතික විගණන කාර්යාලය වෙත ලබා දෙන ලෙස දන්වන ලදී. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් මෙම නඩුවලට අදාල වර්ථමාන ප්‍රගතිය ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් නොකල බැවින් නීති අංශය මගින් විමසීමේදී නඩු දෙකක් අවසන් කර ඇති බවත්, තීන්දුව නීති අංශය මගින් ලබාගෙන නොමැති බව ප්‍රකාශ කල බවත් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.<br>නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ අංක SCFR 224/2024 දරණ නඩුව හා CA (Writ) | | ලේකම්, සෞඛ්‍ය අමා./ප.සෞ.සේ.අ. | 02 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ 06 වන වගඋත්තරකරු ලෙස අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ද, 7,8,9 වන වගඋත්තරකරුවන් ලෙස කැකිරාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හා කැකිරාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දෙදෙනෙක් ඇතුළුව වගඋත්තරකරුවන් 14 දෙනෙකුට | | | 620/2024 යන නඩු අවසන් කර ඇති බවත් එම තීන්දුව ලබා ගැනීම සඳහා මෝෂන් ගොණු කර ඇති බවත්ය.<br>108 L කැකිරාව දිසා අධිකරණයේ නඩුව විභාග වෙමින් පවතින බවත්, Writ – 04/2024 නඩුව 2026.03.26 දින නියෝගය සඳහා නියමිත බව ද නීති නිලධාරී විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| | 02 | 108 L කැකිරාව දිසා අධිකරණය | **කැකිරාව මූලික රෝහලේ ඉඩම සම්බන්ධව**<br>කැකිරාව, යකල්ල පාර, දහම් සෙවන, ඩබ්..එම්. | | | | | | |
| | 03 | Writ – 04/2024 ගරු මහාධිකරණය | ස්ථාන මාරු කිරීමක් සම්බන්ධව<br>තන්තිරිමලය ප්‍රාදේශීය රෝහලේ උපස්ථායක පී. ධනපාල යන | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | පෙත්සම්කරු විසින් 09 වන වගඋත්තරකරු වශයෙන් උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඇතුළුව වගඋත්තරකරුවන් 10 දෙනෙකුට | | | | | |
| | 04 | CA (Writ) 620/2024 ගරු අභියාචනාධිකරණය | තනතුරක් නොලැබීම සම්බන්ධව රඹුක්කන, රෝහල පාර, අංක 13 ලිපිනයෙහි පදිංචි වෛද්‍ය පද්ම කුමාර් වික්‍රමසිංහ මහතා විසින් 13 වන වගඋත්තරකරු වශයෙන් උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඇතුළු වගඋත්තරකරුවන් 119 දෙනෙකුට | | | | | |
| 38 | **පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය**<br>**01. ස්වස්ථ පද්ධතිය පිළිබඳ පරීක්ෂාව**<br>අනුරාධපුර ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයෙන් ස්වස්ථ පද්ධතිය හරහා ඖෂධ ලබා | | | | ආයතන 39 ම යාවත්කාලීන කර ඇති බව දන්වා ඇත.<br>එහෙත් ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති විසින් ප්‍රකාශ | | ලේකම්, ප.සෞ.අමාත්‍යාංශය/ප.සෞ.සේ.අ. | 03 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගැනීමේ දී ඖෂධ ඇණවුම පමණක් ලබා දී ඖෂධ ලබා ගන්නා නමුත්, ස්වස්ථ පද්ධතිය යාවත්කාලීන කර නොගන්නා ක් විගණනයේ දී නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් මෙම පද්ධතියෙන් අපේක්ෂිත අරමුණු වන එක් එක් ආයතනයේ පවතින ඖෂධ තොග ප්‍රමාණය ඒවායේ කල් ඉකුත්වීමේ දිනයන් හා අවශ්‍ය ඖෂධ ප්‍රමාණයන් යනා දී තොරතුරු යාවත්කාලීනව ලබා ගැනීමට නොහැකි වී තිබුණි. විස්තර පහත දැක්වේ.<br>1. රඹෑව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය<br>2. බන්ධනාගාර රෝහල<br>3. තිරප්පනේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය<br>4. ගම්බිරිගස්වැව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය<br>5. ගාලදිවුල්වැව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය<br>6. කටියාව ප්‍රාදේශීය රෝහල C<br>7. ගල්කිරියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | | කරන ලද්දේ වර්ථමානය වන විට 17 ක් අක්‍රිය බවය. මෙහිදී අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙය ඖෂධවේදීන් විසින් සිදුකල යුතු වුවත් බොහෝ ආයතනවල ඖෂධවේදීන් නොමැති බැවින් වෙනත් කාර්ය මණ්ඩලය යොදවා ගෙන සිදු කරන බවත් ඔවුන්ට ඒ සදහා අවශ්‍ය පුහුණුව නොමැති බැවින් සියළු ආයතනවල මෙය ක්‍රියාත්මක නොවන බවය. එහෙත් නිලධාරීන් පුහුණුකර මෙම පද්ධතිය සම්පූරණයෙන් යාවත්කාලීන කරන බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. එසේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මට්ටමින් මෙම පද්ධතියේ භාවිතය සීමිත බවද ප්‍රකාශ කරන ලදී.<br>ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති විසින් මෙම පද්ධතිය ඵලදායී | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
|---|---|---|---|---|---|---|---|
| | නිවාසවල ජල බිල්පත් හා විදුලි බිල්පත් වටිනාකමින් සියයට 70 ක් පළාත් සභාව විසින් ගෙවා තිබීම නිසා 2015 වර්ෂය දක්වා රජයට රු.1,199,338 ක පාඩුවක් සිදුවී තිබුණි. | | | | | | |
| 11 | නිලධරයෙකුගේ පරිවාස කාලය අවසන්වීමේදී ඔහු සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම් අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු වුවත්, උතුරු මැද පළාත තුළ පිහිටි පාසැල් වල 1989 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ගුරු සේවයට පත්වීම් ලැබූ ගුරුභවතුන් 313 දෙනකු | | | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම 313 තුල කැබිතිගොල්ලෑව කලාපයේ දෙවරක් සටහන් වීම් එකක්ද, තඹුත්තේගම කලාපයේ දෙවරක් සටහන් වීම් 14 ක්ද, සේවය හැරයාම් 02 ක්ද, ඉල්ලා අස්වීම් 02 ක්ද විශ්‍රාම යෑම් 04 ක්ද(සේවය ස්ථිර කර ඇත) මියගිය දෙදෙනෙකු ද ඇතුලත් බවය. එසේම විදේශ ප්‍රතිඵල සනාථ නොවීම් 9 ක් සහ බෙල්වුඩ් නඩුවට සම්බන්ධ 3 ක්ද විනය පරීක්ෂණ 1 ක් හා හදිසි අනතුරු ගොණු 1 ක් ද පවතින බවත්, ඒවා හැර අනෙකුත් ගොණු සම්බන්ධයෙන් කටයුතු | | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.<br>තවදුරටත් ගුරුභවතුන් 57 දෙනෙකුගේ ස්ථිර කිරීම නොකර පරිවාස කාලය ඉක්මවා වැටුප් සහ දීමනා ගෙවමින් පවතී. | | | අවසන් කර ඇති බව ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 12 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ලැබුණු වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂවලින් එකතු වටිනාකම රු.1,094,657 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 බැගින් අඩංගු මළු 77 ක් අස්ථානගත වී තිබූ අතර, රු.23,497,597 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 ක් අඩංගු මළු 1750 ක් අනුරාධපුර දුම්රියපලේ දුම්රිය ගැල්තුළ (Wagon) මාස 02 කට වැඩි කාලයක් | | | • මූලික විමර්ශනයක් පවත්වා නිරික්ෂණ හා නිර්දේශ සහිත වාර්තාවක් ලබා දෙන ලෙස රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත 2025 නොවැම්බර් 22 දින දැනුම් දී ඇත.<br>• මෙම කටයුත්තට සම්බන්ධ විෂය ලිපිකරු විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2.12 ප්‍රකාරව විශ්‍රාම යවා ඇත.<br>• මේ සම්බන්ධයෙන් පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවට | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ත්‍රිපෝෂ සම්බන්ධ රාජකාරි එහි ගිණුම් අංශයට පවරන ලෙස දන්වන ලදී.<br>ත්‍රිපෝෂ බෙදා හැරීමේ ලේඛන විධිමත්ව පවත්වා ගන්නා ලෙසද ඒ සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදු කරන ලෙසද ගණකාධිකාරී වෙත උපදෙස් දෙන ලදී. | ප.සෞ.සේ.අධ්‍යක්ෂ/අ.පුර ප්‍රා.සෞ.සේ.අධ්‍යක්ෂ | 08 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | නිදහස් කර ගැනීමකින් තොරව රඳවා තැබීමට ඉඩ හැර තිබුණි. දුම්රිය මැදිරි තුළ ත්‍රිපෝෂ පැවති කාලය තුළ පැවති සෙල්සියස් අංශක 45 ක උෂ්ණත්වය තුළ ත්‍රිපෝෂවල ගුණාත්මකභාවය අඩුවීමේ අවධානමක් පැවතුණි. වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂ තොගය ප්‍රතිලාභීන් වෙත ලැබෙන විට කල් ඉකුත්වීමට ආසන්නව පැවතුණි. මෙම ත්‍රිපෝෂ තොග නියමිත කාලය තුළ දුම්රිය ගැල්වලින් ඉවත් කර නොගැනීම නිසා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,080,000 ක මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. | | | පරීක්ෂණයක් සිදු කරන ලෙස ගිණුම් කාරක සභාව නියෝග කල බවත් ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් 2020.08.28 දිනැතිව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත වාර්තාවක් නිකුත් කර ඇති බවත් එහිදී මෙහි දක්වා ඇති අඩුපාඩු සියල්ලම පෙන්වා දී ඇති බවත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සදහන් කරන ලදී. එහිදී අභ්‍යන්තර විගණනය මගින් පෙන්වා දෙන අභ්‍යන්තර පාලන දුර්වලතා නිවැරදි කර නොගැනීම හේතුවෙන් මෙම තත්වය පැන නැගී ඇති බවත් ඇය විසින් ප්‍රකාශ කල අතර, නැවතත් ඒ සම්බන්ධයෙන් පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවටම පරීක්ෂණයක් කිරීමට සිදු වී ඇති | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | බවද සඳහන් කරමින් අභ්‍යන්තර විගණනය මගින් පෙන්වා දෙන අභ්‍යන්තර පාලන දුර්වලතා නිවැරදි කර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. මේ ආකාරයෙන්ම ඉදිරියේදී පළාත් සමූපකාර දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් අරමුදල සම්බන්ධයෙන් ද මෙම තත්වයම උදා විය හැකි බව ද ඇය විසින් තවදුරටත් ප්‍රකාශ කරමින් පෙන්වා දෙන අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණික ඉල්ලීමක් සිදු කරන ලදී.<br>අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ත්‍රිපෝෂ සම්බන්ධ රාජකාරි එහි ගිණුම් අංශයට පවරන ලෙස පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇති නමුත් මෙතෙක් එය ගිණුම් අංශයට | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | පවරා නොමැති බවද ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් පෙන්වා දෙන ලදී.<br>• අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් එම කාර්යාලයේ කාර්ය මණ්ඩල ඌනතාවය පිළිබඳව ප්‍රකාශ කරන ලදී. | | | |
| 13 | 2021 පෙබරවාරි 01 දිනැති 2020/06 (i) චක්‍රලේඛය හා 2020 ඔක්තෝබර් 13 දිනැති හා අංක අමප/20/1622/322/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ඉඩම් කොමසාරිස්වරයා විසින් ඉඩම් කට්ටි 08 කට බදු සහන ලබා දීම හේතුවෙන් පළාත් සභාවට රු.73,404,958 ක බදු මුදලක් අහිමි වී තිබුණි.<br>(2024 පළාත් සභා වාර්තාවේ 1.6.1 ඇ ඡේදය) | | | 2025.06.11 දිනැතිව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් ඇමතූ ඉඩම් කොමසාරිස් ජනරාල් ගේ අංක 4/10/පොදු /බදු සහන//(1,2) දරණ ලිපිය අනුව මෙම ඉඩම් කට්ටි 08 සඳහා ලබා දි තිබූ බදු සහන ඉවත් කර හිග බදු මුදල් ද සමග බදු අයකර ගැනිමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව නැනුප ප්‍රාදේශීය ලේකම් විසින් එම බදුකරුවන් දැනුවත් කර ඇත. එහෙත් ඔවුන් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බව | මේ සම්බන්ධයෙන් නීතිපතිගේ උපදෙස් පතන බවත් එතෙක් බදුකරුවන් සමග පෞද්ගලිකව සාකච්ඡා කර අයකර ගැනීමට උත්සාහ කරන ලෙස දන්වා ඇති බව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | පළාත් ඉඩම් කොමසාරිස් | 11 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | බදුකරුවන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.73,404,958 ක හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී.<br>අභියාචනා සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නැත. උපලේඛණ අවලංගු කිරීමට බදු ඔප්පු ආපසු භාර දෙන ලෙස දන්වා ඇතත් මෙතෙක් ඒවා භාර දී නොමැති බව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. | | | |
| 14 | මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් අක්කර 80 ක භූමි ප්‍රමාණයක් දේශීය ආයෝජකයින් 20 දෙනෙකු සඳහා 2022 වර්ෂයේ සිට දීර්ඝ කාලීන බදු අනුමැතියට යටත්ව වසර 35 ක කාලයකට ලබා දී තිබුණු අතර, බදු අනුමැති ලිපියේ "ඇ" වගන්තිය ප්‍රකාරව බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී ඉඩම සංවර්ධනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට | | | 2024 වර්ෂය අවසාන වන විට වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය සියයට 60 දක්වා වර්ධනය කිරීමට ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතියේ ඉඩම් කට්ටි 22 ම ඉඩම් සංවර්ධන කටයුතු ආරම්භ නොකර තිබීමෙන් වල්බිහි වී තිබුණි. | | පළාත් ඉඩම් කොමසාරිස් | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | බලපත්‍රලාභීන් 16 දෙනෙකු එසේ ඉඩම් සංවර්ධනය සිදුකර නොතිබුණි. (5.3 (ඇ) ඡේදය) | | | | | | |
| 15 | 2017 අගෝස්තු 02 දිනැතිව සංශෝධිත ගිවිසුම් වටිනාකම වූ රු.3,723,534,071 ක් අනුව විශේෂ මාර්ග සංවර්ධනය (නාගරික හා ප්‍රාදේශීය මාර්ග) කිරීමේ ව්‍යාපෘති 217 ක් සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට (CECB) අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව ලබා දුන් රු.221,111,400 ක අත්තිකාරම් මුදලින් රු.128,316,501 ක් පියවා නොතිබුණි. (5.4 ඡේදය) | | | මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදුකරමින් පවතින නමුත් එය අවසන්කර නොමැත. | | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | අංක පීඑස්/සීඑස්ඒ/11-18 හා 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 4.3 ඡේදය අනුව හිටපු ආණ්ඩුකාර තුමා වෙත නිල වාහන 02 ක් හා අවශ්‍ය නම් ආරක්ෂක රථයක් ලබා ගැනීමත් එම එක් රථයකට මසකට ඩීසල් ලීටර් 500 ක වටිනාකමකට සමාන ඉන්ධන දීමනාවක් ලබාගැනීමට හිමිකම් තිබුණු නමුදු 2020 අප්‍රේල් සිට 2021 ජූනි 21 දක්වා වූ මාස 12 ක කාල පරිච්ඡේදය තුළ එවකට හිටපු ආණ්ඩුකාරතුමන් වෙත මසකට ඩීසල් ලීටර් 1500 ක් ඉක්මවා අතිරේකව එකී මාස 12 තුළ රු.1,177,000 ක වටිනාකමකට සමාන ඩීසල් ලීටර් 11,320 ක් ජනාධිපති ලේකම්ගේ පූර්ව අවසරය ලබා ගැනීමකින් තොරව | | | සීමාව ඉක්මවා ගෙවා ඇති රු.1,177,000 ක මුදල ආපසු ගෙවා ඇත. | | ආණ්ඩුකාරවර ලේකම් | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | හිටපු ආණ්ඩුකාරතුමන් වෙත අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණි. | | | | | | |
| 16 | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ලංසු ඇගයීම් කරන අවස්ථාවේදී තාක්ෂණික පිරිවිතරවලට අනුකූලව ලංසු ඉදිරිපත් කර තිබිය දී හා අලෙවියෙන් පසු සේවා සැපයීමට නියෝජිතවරයකු සිටිය දී සේවා ස්ථානයක් නොමැති ලෙස දක්වා අවම මිල ප්‍රතික්ශේප කිරීම හේතුවෙන් අවස්ථා 02 කදී Smart board 135 ක් මිලදී ගැනීමේදී රු.4,050,000 ක හා Desktop Computer 207 ක් මිලදී ගැනීමේදී රු.7,890,840 ක අලාභයක් සිදුවී තිබුණි. | | | මෙයට අදාලව පළාත් භාණ්ඩාගාරය වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(මුදල්) විසින් ප්‍රකාශ කරන ලදී. | මෙවැනි මිලදී ගැනීම් සඳහා manufacture autarization ඇති අය වෙතින් මිල ගණන් කැඳවීම සිදුකල යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කල අතර, අදාල පිටරට සමාගම විසින් මෙරට ලංසුකරු වෙත manufacture autarization දිය යුතු බව ද ප්‍රකාශ කරන ලදී. එහිදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(මුදල්) විසින් ප්‍රකාශ කරන ලද්දේ තෝරාගත් සැපයුම්කරු manufacture autarization ඇති අයෙකු බවය. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | 01 |
| 17 | ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සේවයේ ගුණාත්මක බව | | | | | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | 01 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | වර්ධනය කිරීම එනම්, ජීවිත කාලය පුරාම විස්තීර්ණ, ප්‍රවර්ධන, ආරක්ෂණ, වැළැක්වීම්, රෝග නිවාරණ, පුනරුත්ථාපන හා රෝග සත්කාර මඟින් ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම මෙන්ම බෝ නොවන රෝග අවධානම ඇති පුරවැසියන් හඳුනාගෙන එම රෝග පාලනය කිරීම හා කළමනාකරණය කිරීම අරමුණින් ලෝක බැංකු ආධාර යටතේ 2019 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ ද, එම අරමුණුවලට පටහැනිව 2019 වර්ෂයේ සිට 2024 ජුලි 31 දින දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ ලද ප්‍රතිපාදනවලින් රු.335,691,431 ක මුදලක් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සත් | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | මහල් නව පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා වැය කර තිබූ අතරම රු.51,609,432 ක මුදලක් එම ගොඩනැගිල්ල සඳහා උපකරණ මිල දී ගැනීමට වියදම් කර තිබූ බව නිරීක්ෂණය විය. | | | | | | |

04. ප්‍රවර්තන රැස්වීමේ සාකච්ජා කල නව කරුණු

| අනු අංකය | කාරණය | තීරණය | වගකිව යුතු නිලධාරියා |
|---|---|---|---|
| | **පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ හෙළිදරවු කිරීම්** | | |
| 01 | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු භූමියෙහි ගාල් කර ඇති ධාවනයේ නොයොදවන වාහන රාශියක් ඇති බවත් මෙම වාහන ස්වභාවික ආපදාවන්ට ලක්වන අයුරින් ගාල් කර ඇති බවත් පෙන්වා දෙන ලදී.<br><br>පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ(පාලන) විසින් ප්‍රකාශ කරන ලද්දේ ධාවනයේ නොයොදවන වාහන 17 ක් එලෙස ගාල් කර ඇති බවත්, ඒවායේ අයිතිය පහත අයුරින් ඇති බවට හදුනාගෙන ඇති බවත්ය.<br>ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත නමින් 05, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් නමින් 02, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් 01, පොලොන්නරුව නි.ප.සෞ.සේවා අධ්‍යක්ෂ නමින් 01, ජනාධිපති ලේකම් නමින් | අයිතිය මෙම පළාත් සභාව සතු නොවන වාහන සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය සම්බන්ධයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත්, පළාත් සභාවට නීත්‍යානුකූල අයිතිය ඇති වාහන සම්බන්ධයෙන් නොපමාව කටයුතු කරන ලෙසත් අනෙකුත් වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙසත් දන්වන ලදී. | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| | 01, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමින් 02, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් නමින් 03, RMV දත්ත පද්ධතියේ ඇතුලත් නොවන 01, පුද්ගලික නමකින් පවතින 01 | | |
| **02** | පාසැල්වලට දරුවන් බඳවා ගැනීමේදී, විවිධ උත්සව සහ පාසැලේ සංවත්සර සැමරීම් වැනි විවිධ කාර්යයන් සඳහා මුදල් රැස් කිරීමේ ප්‍රවනතාවය ඉහළ යමින් පැවතීම. මේ හේතුවෙන් නාමිකව හා නිර්නාමිකව පෙත්සම් ලැබීමද ඉහල ගොස් ඇති බවත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදී. උදාහරණයක් ලෙස අනුරාධපුර තේ.බී.රත්නායක විද්‍යාලය සඳහන් කරන ලදී.<br>පාසැල් දරුවන්ගෙන් මුදල් එකතු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබා දී චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කල අතර, ඒ පිළිබඳව කලාප මට්ටමින් විදුහල්පතිවරුන් දැනුවත් කර අවසන් බව ද ප්‍රකාශ කරන ලදී. | පාසැල් දරුවන්ගෙන් මුදල් එකතු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ දැන්වීමක් සකස් කර පාසැලේ ස්ථාන කිහිපයක ප්‍රදර්ශනය කලයුතු බවත්, එහිදී මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් ගැටළු ඇත්නම් ඒ පිළිබඳ දැනුම් දිය යුතු අයගේ දුරකතන අංකයන් ද සඳහන් කිරීම යෝග්‍ය බවත් දන්වන ලදී. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| **03** | පළාත් සභාවේ ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ආදායම් සම්බන්ධ විගණන කමිටු පැවැත්වීමට කටයුතු නොකිරීම<br>• පළාත් සමුපකාර අමාත්‍යාංශ ලේකම්<br>• පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්<br>• පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්<br>• නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්)<br>• පළාත් ආදායම් කොමසාරිස්<br>• පළාත් ඉඩම් කොමසාරිස් | ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ආදායම් සම්බන්ධ විගණන කමිටු පැවැත්වීමේ ප්‍රගතිය දක්වමින් ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | සියළුම ආදායම් ගණන්දීමේ නිලධාරීන්/ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **04** | උතුරු මැද පළාත් සභා අරමුදල් මගින් නඩත්තු කරනු ලබන විවිධ ආයතන යටතේ පවතින සංචාරක බංගලා විධිමත් පරිදි නඩත්තු නොකිරීම මත ඒ වෙනුවෙන් වාර්ෂිකව දරන අධික වියදමට ප්‍රමාණවත් උපයෝජනයක් සිදු නොවීම. එවැනි අවස්ථාවක් ලෙස පළාත් කෘෂිකර්ම අමාතයාංශය යටතේ පවතින පොළොන්නරුව සංචාරක බංගලාව වෙනුවෙන් 2019 වර්ෂයේ සිට 2025 දක්වා වර්ෂ 07 ක කාලය | සංචාරක බංගලා විධිමත් පරිදි නඩත්තු කිරීම පිළිබඳව හා ඒවා පිළිබඳ ප්‍රමාණවත් ප්‍රචාරයන් ලබා දීම සම්බන්ධවත් සාකච්ඡා විය. | නි.ප්‍ර.ලේ(පාලන)/ලේකම්, ප.කෘෂි.අමාත්‍යාංශය/ ලේකම්, ප්‍රධාන |

| | | | |
|---|---|---|---|
| | තුල නඩත්තු කටයුතු වෙනුවෙන් රු.10,496,023.32 ක මුදලක් දරා තිබුනත් එම වසර 07 ක කාලය තුල අමුත්තන් නවාතැන් ගත් දින ගණන දින 306 ක් පමණක් වීම.<br>උතුරු මැද පළාත් සභා අරමුදල් මගින් නඩත්තු කරනු ලබන සංචාරක බංගලා-<br>• පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ සංචාරක බංගලාව, පොළොන්නරුව<br>• මල්වානේගම සමුපකාර දෙපාර්තමේන්තු පුහුණු මධ්‍යස්ථානය<br>• ආයුර්වේද දෙපාර්තමේන්තු සංචාරක බංගලාව, අනුරාධපුර<br>• පළාත් ප්‍රධාන අමාත්‍යාංශ සංචාරක බංගලාව පොළොන්නරුව<br>• ප්‍රධාන ලේකම් කාර්යාලීය සංචාරක බංගලාව, අනුරාධපුර<br>සංචාරක බංගලා භාරකරුවන් දෙපාර්තමේන්තුගතව බඳවා ගැනීම මත ස්ථාන මාරු නොවී දීර්ඝ කාලයක් එකම ස්ථානයේ සේවය කරන බවද සාකච්ඡා විය. | | අමාත්‍යාංශය/ප.සමු.කොමසාරිස්/ප.ආයුර්වේද කොම. |
| **05** | බස් නැවතුම්පලවල් සහ මගී ආවරණ නඩත්තුව පිළිබඳ පසු විපරම් පරීක්ෂාව - මාර්ගස්ථ ප්_රවාහන සේවා අධිකාරිය, උතුරු මැද පළාත<br>මෙහිදී ප්‍රධාන වශයෙන් බස් නැවතුම්පලවල්වල වැසිකිලි පිරිසිදු නොකිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කල අතර, ඉවත් කල යුතු පැරණි මගී ආවරණ ඉවත් නොකිරීම මත ගැටළු පවතින බවත්, මහජනතාවගෙන් ඒ සම්බන්ධව පැමිණිලි ලැබෙන බව ද ප්‍රකාශ කරන ලදී.<br>මේවා නඩත්තු කිරීම (වැසිකිලි පිරිසිදු කිරීම) ප්‍රාදේශීය සභා මගින් සිදු කල යුතු බව ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලද අතර ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතිය එම අධිකාරියට පවරන්නේ නම් නඩත්තුව සිදුකල හැකි බව ද ප්‍රකාශ කරන ලදී. ඉවත් කල යුතු පැරණි මගී ආවරණ ඉවත් කිරීමට තීරණයක් ගෙන ඇති බව ද ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී. | රෙකෝජින් අහන්න | සභාපති, ප්‍රවාහන සේවා අධිකාරිය/පළාත් පාලන කොමසාරිස් |
| **05.** | **විගණකාධිපති විගණන විමසුම් මගින් හෙළිදරවු කල විශේෂ කරුණු හා ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂණ** | | |

<table>
<tr>
<td>01</td>
<td>2026 පෙබරවාරි 28 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් පළාත් සභාවේ ආයතන 04 ක් එසේ සිදුකර නොතිබුණි.<br>
<table>
<tr><td>ආයතනය</td><td>ගිණුම් ඉදිරිපත් කර ඇති දිනය</td></tr>
<tr><td>----------</td><td>-------------------------------</td></tr>
<tr><td>කෘෂි සංවර්ධන අත්තිකාරම් ගිණුම</td><td>2026.03.04</td></tr>
<tr><td>පේෂ කර්මාන්ත කටයුතු අත්තිකාරම් ගිණුම</td><td>2026.03.09</td></tr>
<tr><td>සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය</td><td>නැත.</td></tr>
<tr><td>සමූපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය</td><td>නැත</td></tr>
</table>
</td>
<td>මූල්‍ය කළමනාකරණ පනත අනුව සියළුම ආයතන පෙබරවාරි 28 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව දන්වන ලදී.</td>
<td></td>
</tr>
<tr>
<td>02</td>
<td>2026 ජනවාරි 31 දිනට ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විගණන විමසුම් 14 කට පිළිතුරු ලබා දී නොතිබුණි .<br>
<table>
<tr><td></td><td>ආයතනය</td><td>නිකුත් කළ විගණ විමසුම් අංකය හා දිනය</td><td>කාරණය</td></tr>
<tr><td></td><td>------------------</td><td>---------------------------</td><td>----------------</td></tr>
<tr><td>01</td><td>ප්‍රධාන ලේකම් කාර්යාලය</td><td>NCPC/AN/F/PRDA/2025/11<br>2025/10/07<br>NCPC/AN/F/DECMA/CM/2025/12<br>2025/08/27</td><td>ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය පරීක්ෂාව<br><br>උතුරු මැද පළාත් සභා සංකීර්ණයෙහි ආරක්ෂක සේවාව සපයා ගැනීම පිළිබඳ පරීක්ෂාව</td></tr>
<tr><td>02</td><td>පළාත් ආදායම් දෙපාර්තමේන්තුව</td><td>NCPC/AN/A/RED/2025/AQ/13<br>2026.1.22</td><td>පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ හිඟ මුද්දර ගාස්තු නිදහස් කිරීම පිළිබඳ විගණනය</td></tr>
</table>
</td>
<td>} පිළිතුරු ලබා දී ඇති බව දන්වන ලදී.<br><br>2026.03.09 දින පිළිතුරු ලබා දී ඇත.</td>
<td></td>
</tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 03 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | NCPC/AN/B/EDU/2025/27(II)<br>2025/07/31 | අ/නො/ පහළ මාරගහවැව විද්‍යාර්ථ මහ විදුහලේ පරිගණක හා ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකවල දොර අගුලු කඩා එහි තිබුණු පරිගණක උපාංග සොරා ගැනීම. | මේ පිළිබද තෙරතුරු සොයාගත නොහැකිව ඇති බව දන්වන ලදී.<br>මෙය මෑතකදී සිදු වී ඇති සිදුවීමක් බැවින් තොරතුරු සොයාගත නොහැකිය යන්න පිලිගත නොහැකි බව දන්වන ලදී. විදුහල්පතිවරයා, කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ඇතුළු නිලධාරීන් කැදවා මේ පිළිබද අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වන ලදී.2025 වර්ෂයේ සිදුවී ඇති<br><br>2026.01.03 දින පිළිතුරු ලබා දී ඇත. | |
| | | | NCPC/AN/B/EDU/2025/29<br>2025/08/13 | අනු/ නොච්චියාගම අල්හික්මා මුස්ලිම් මහා විද්‍යාලයේ මහජන නියෝජන පරීක්ෂාව - 2025 | | |
| | | | NCPC/AN/B/EDU/2025/36<br>2025/08/22 | ද්විතීක අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP) – 2024 - උතුරු මැද පළාත පිළිබද විගණන පරීක්ෂාව. | තොරතුරු කැදවා ඇත. තොරතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂිතයි. | |
| | | | NCPC/AN/B/EDU/2025/37<br>2025/09/18 | කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලයේ මූල්‍ය හා කාර්ය සාධන විගණනය - 2025 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | NCPC/AN/B/EDU/2025/44<br>2025/10/27 | අනුරාධපුර කැබිතිගොල්ලෑව මධ්‍ය මහා විද්‍යාලයේ සෝදිසි විගණන පරීක්ෂාව | | |
| | | NCPC/AN/B/EDU/2025/45<br>2025/12/22 | අනුරාධපුර ශාන්ත ජෝශප් මහා විද්‍යාලයේ සෝදිසි විගණන පරීක්ෂාව | පිළිතුරු කෙටුම්පත් කර අවසන්. ඉදිරිපත් කල හැක | |
| 04 | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | NCPC/C/PHM/2025/AQ – 08<br>2025.02.13 | 2024 වර්ෂයේ අවසන් දින කිහිපය තුළදී කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළැඹීම සම්බන්ධව පරීක්ෂාව | 2025.05.08 දින පිළිතුරු යවා ඇත. එහි පිටපතක් නැවත විගණනය වෙත ලබා දෙන ලෙස දන්වන ලදී. | |
| 05 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | NCPC/C/RDHS/2024/C/AQ-16<br>2024.05.10 | අංක 227 – 4204 දරන ලොරි රථය විගණන පරීක්ෂාව | අතුරු පිළිතුරක් ලබා දී ඇත. අවසන් පිළිතුරු ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | |
| | | NCPC/AN/C/PDHS/2025/A/AQ-30<br>2025.07.29 | අනුරාධපුර ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ මූල්‍ය හා කාර්යසාධන විගණනය - 2025 | පිළිතුරු යවා ඇත | |
| | | NCPC/AN/C/PDHS/2025/A/AQ-38<br>2025.11.10 | අනුරාධපුර ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ විදුලි ජනන යන්ත්‍රයේ ඉන්ධන දහනය පිළිබඳ විගණන පරීක්ෂාව - 2025 | පිළිතුරු යවා ඇත | |
| 06 | පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | NCPC/E/DCD/2024/48<br>2025.01.03 | සී/ස විලච්චිය විවිධ සේවා සමුපකාර සමිතියේ සහල් සැකසුම් මධ්‍යස්ථානයේ වර්තමාන ක්‍රියාකාරිත්වය පරීක්ෂාව | 206.03.09 පිළිතුරු යවා ඇත. | |

| | | | |
|---|---|---|---|
| **03** | පළාත් සභාවේ සියළුම ආයතනවල 2024 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ සිදුකිරීමේ ප්‍රගතිය දෙවන කාර්තුවේ අමාත්‍යාංශ විගණන කමිටුවලදී ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | මෙයට අදාලව තොරතුරු ඉදිරිපත් කල යුතු ආකෘතියක් හඳුන්වා දෙන ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දන්වන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
| **04** | 2025 වර්ෂයේ අවසානයට මූලික විමර්ශන, ප්‍රධාන අමාත්‍යාංශයේ 24 ක් ද, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 25 ක් ද, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 33 ක්ද අවසන් කර නොතිබුණි. | මෙහි ප්‍රගතිය ද අමාත්‍යාංශ විගණන කමිටුවලදී ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
| **05** | 2024 හා 2025 වර්ෂවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කරන ලද ප්‍රධාන කරුණක් වූ උතුරු මැද පළාත් සභාවේ වසර 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන විගණන වාර්තා වලින් පැන නැගුණු කරුණු මත යොමු කරන ලද නමුත් එම අලාභය හෝ පාඩුව වූ අවස්ථාවේදීම සිදුකළ යුතු පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව (මුදල් රෙගුලාසි 104 (4)) සිදු කළ යුතු පරීක්ෂණ 14 ක් ද, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වාහන අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ 200 ක් ද පවත්වා අවසන් කර නොතිබුණි. තවද දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ හානිවීම් සම්බන්ධයෙන් අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලය සහ එයට අයත් පාසල් 04 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් නොතිබුණි. | මෙහි ප්‍රගතිය ද අමාත්‍යාංශ විගණන කමිටුවලදී ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.<br>පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ එකම වාහන අනතුරු නැවත නැවත සිදුවන බවට වාර්තා වන අවස්ථා වාර්තා වී ඇති බැවින් ඒ පිළිබදව ද සොයා බැලිය යුතු බව දන්වන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
| **06** | 2025 වර්ෂයේදී අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විමසුම් 19 කට පිළිතුරු ලබා දී නොතිබුණු අතර එම දෙපාර්තුමේන්තුව විසින් ප්‍රධාන ලේකම් වෙත නිකුත් කරන ලද විශේෂ විමර්ශන වාර්තා 19 ක් හා 2024 වර්ෂයට පෙර නිකුත් කරන ලද විශේෂ විමර්ශන වාර්තා 46ක් සම්බන්ධයෙන් පසු විපරම් කර නොතිබුණි | නිර්දේශ ක්‍රියාත්මක කර සනාථ කර තිබිය යුතු බව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වන ලදී. ඒ සඳහා සෑම ආයතනයකම වැරදි නිවැරදි කිරීමේ ලේඛණයක් පවත්වා ගෙන යාම මගින් නැවත එකම වරද සිදු වීම අවම කර ගත හැකි බව ද දන්වන ලදී. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
| **06** | පිළිතුරු නොලද විගණන වාර්තා පලාත් අභ්‍යන්තර විගණන හා වමර්ශන දෙපාර්තමේන්තුව | | |

| අනු අංකය | විගණන වාර්තාවේ අංකය | විගණන වාර්තාවේ නම සහ විගණිත ආයතනය | නිකුත් කරන ලද්දේ කාටද | නිකුත් කරන ලද දිනය | |
|---|---|---|---|---|---|
| 01 | NCP/IA/05/ILRDW/14/25 - 127 | 2024 විශේෂ ව්‍යාපෘති (විචල්‍ය) ක්‍රියාත්මක කිරීම යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාව - පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය, උ.මැ.ප. | 2025.12.08 | සතියක් තුල පිළිතුරු ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී |
| 02 | NCP/IA/01/EDU/26/25-93 | පාසල් ආහාර හා පෝෂණ වැඩසටහන පිළිබඳ පරීක්ෂාව-මැදවච්චිය ශ්‍රී සෝභිත විද්‍යාලය | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, උ.මැ.ප. | 2025.09.12 | පිළිතුරු මෙම සතියේ යොමු කල බව ප්‍රකාශ කරන ලදී |
| 03 | NCP/IA/01/EDU/08/25 -111 | පාසල් පෝෂණ ආහාර වැඩසටහන පිළිබඳ පරීක්ෂාව - පො/දිඹු/මනම්පිටිය දෙමළ මහා විද්‍යාලය | - එම - | 2025.11.19 | - එම - |
| 04 | NCP/IA/01/EDU/09/25-125 | ශ්‍රී රාහුල මහා විද්‍යාලය - ආයතන හා මුල්‍ය කටයුතු පිළිබඳ විගණන පරීක්ෂාව | - එම - | 2025.11.25 | - එම - |
| 05 | NCP/IA/04/ID/08/25-144 | ප්‍රධාන නිමි රෙදිපිළි තොග ගබඩාව පිළිබඳ පසුවිපරම් පරීක්ෂාව - පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ, උ.මැ.ප. | 2025.12.24. | තොග ඌනතාවයක් පවතී. පිළිතුරු ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී |

| | | | | | |
|---|---|---|---|---|---|
| 06 | NCP/IA/03/PDHS/24/25-71 | මුල්‍ය හා කළමනාකරණ කටයුතු පිළිබඳ පරීක්ෂාව- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වැලිකන්ද | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,උ.මැ.ප | 2025.07.29 | තොරතුරු කැඳවා ඇත. තොරතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී. |
| 07 | NCP/IA/03/PDHS/24/25-72 | ඖෂධ තොග , ගබඩා හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ පරීක්ෂාව - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වැලිකන්ද | - එම - | 2025.08.06 | |
| 08 | NCP/IA/03/RDHS/19/25-133 | අනුරාධපුර ප්‍රා.සෞ.සේ.අ.කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ පරීක්ෂාව | - එම - | 2025.12.05 | |
| 09 | NCP/IA/03/RDHS/17/25-121 | මිලදී ගැනීම් පිළිබඳ පරීක්ෂාව-ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර | - එම - | 2025.12.16 | |
| 10 | NCP/IA/03/RDHS/17/25-148 | කළමණාකරන, මූල්‍ය හා ඖෂධ තොග පාලනය පිළිබඳ විගණන පරීක්ෂාව<br>මඩාටුගම හා ගම්බිරිගස්වැව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක | - එම - | 2025.12.16 | |
| 11 | NCP/IA/03/PDHS/24/25-114 | භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ පරීක්ෂාව - ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය පොළොන්නරුව. | - එම - | 2025.12.16 | |
| 12 | NCP/IA/03/RDHS/19/25-146 | වෙ නාශක යෙදීම පිළිබඳ පරීක්ෂාව- ප්‍රා.සෞ.සේ.අ කාර්යාලය, අනුරාධපුර | - එම - | 2025.12.23 | |
| 13 | NCP/IA/01/LGIP/15/25-140 | ආයතන පරිපාලන බදු වට්ටෝරු ලේඛණ හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන ආයතන පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව (ඉපලෝගම ප්‍රාදේශීය සභාව ) | පළාත් පාලන කොමසාරිස්, උ.මැ.ප. | 2025.12.06 | ප්‍රාදේශීය සභාව මගින් පළාත් පාලන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | කොමසාරිස් වෙත පිළිතුරු ලබා දී ඇත. විගණනය වෙත කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී |
| 14 | NCP/IA/01/LGIP/15/25-139 | ගෙවීම් වවුචර් ,ප්‍රසම්පාදන කටයුතු ,ලැබිය යුතු ආදායම් සහ ගෙවිය යුතු වියදම් සහ කඩකාමර කුලියට දිම සම්බන්ධයෙන් ගිවිසුම්ගත විම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව (ඉපලෝගම ප්‍රාෙද්ශිය සභාව ) | - එම - | 2025.12.16 | - එම- |
| 15 | NCP/IA/05/PRDA/14/25 - 150 | වත්කම් කළමනාකරණය සහ භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ පිරික්ෂාව - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | සාමාන්‍යාධිකාරි, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, උ.මැ.ප. | 2025.12.15 | පිළිතුරු ඉදිරිපත් කර ඇත. |
| 16 | NCP/IA/05/PRDA/14/25 - 141 | විධායක ඉංජිනේරු කාර්යාලවල තාර බැරල් තොග පවත්වා ගැනීම පිළිබඳ පරික්ෂාව - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | - එම - | 2025.12.24 | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| 17 | NCP/IA/03/RDHS/17/26-03 | කළමනාකරණ හා මුල්‍ය කටයුතු පිළිබද අභ්‍යන්තර විගණන වාර්තාව - පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ, | 2026.02.12 | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | |
| 18 | NCP/IA/02/PDA/12/26- 04 | භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2026.02.03 | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| 19 | NCP/IA/03/PDHS/09/26-06 | ආයතන පරිපාලන කටයුතු හා ඖෂධ තොග පිළිබඳ පරික්ෂාව- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 2026.02.03 | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

**පාලිත ආයතනවලට අදාලව පළාත් සභා විගණන හා කළමනාකරණ කමිටු මට්ටමෙන් විසඳාගත යුතු කරුණු සාකච්ඡා කිරීම**

| | | | |
|---|---|---|---|
| **01** | **පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව-**<br><br>මිනින්දෝරු ඊ.එම්.අමරසේකර මහතා විසින් අංක HC 184/2012 දරණ නඩුවෙන් නිදොස් කොට නිදහස් කිරීම හේතුවෙන් ඔහු විසින් මෙම නඩුව වෙනුවෙන් වැය කල නීතිඥ ගාස්තු ලෙස රු.1,277,000.00 ක මුදලක් ඉල්ලා සිටීම.<br><br>අමරසේකර මහතා විසින් වැය කල නීතිඥ ගාස්තු වෙනුවෙන් ඉදිරිපත් කල ඇති බිල්පත්වල නිවැරදිතාවය තහවුරු කර ගෙවීම් කරන ලෙස උපදෙස් ලැබී ඇතත් එම බිල්පත් තහවුරු කර ගැනීමේ ගැටළුවක් පවතින බව පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව නීතිපති වෙතින් ද විමසූ බවත් නිවැරදිතාවය තහවුරු කරගෙන ගෙවීම් කරන ලෙස උපදෙස් ලැබී ඇති බව ද දන්වන ලදී. | මේ සම්බන්ධයෙන් සොයා බලා පිළිතුරක් ලබා දෙන බව දන්වන ලදී. | නි.ප්‍ර.ලේ(පාලන) /පළාත් ඉඩම් කොමසාරිස් |

| වෙනත් කරුණු පිළිබද සාකච්ඡා කිරීම | | | |
|---|---|---|---|
| **01** | 2025.04.28 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2025 හි ඇමුණුම 09 අනුව අභ්‍යන්තර විගණන වාර්තාවේ ආකෘතිය වෙනස් වීම මත කළමනාකරණයේ අදහස් ලබා ගැනීම විගණන වාර්තාව සඳහා පිළිතුරු ලබා දීමක් ලෙස ඇතැම් ආයතන අදහස් කරන බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදී. එබැවින් අභ්‍යන්තර විගණන වාර්තාව නිකුත් කල පසු එයට පිළිතුරු ලබා දිය යුතු බව ඇය විසින් දන්වන ලදී. කළමනාකරණයේ අදහස් විමසීමේදී ලබා දුන් පිළිතුරු අනුව කටයුතු කර අදාල නිවැරදි කර ගැනීම් සිදු කර ගෙන ඇද්ද යන්න පිළිබද සොයා බලා විගණනය වෙත පිළිතුරු ඉදිරිපත් කල යුතු බව ද ඇය විසින් වැඩිදුරටත් පැහැදිලි කරන ලදී. | | |

**05. අදහස් දැක්වීම**

05.1 . කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඩී.ඩබ්.එස්.රංජිත් මහතා විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ ඔහු විසින් වැඩිම කාලයක් ගත කරන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම මෙය බවත්, මෙය ඉතාම සංකීරණ රැස්වීමක් බවත්ය. මෙහිදී කිවයුතු වන ප්‍රධානම කරුණ නම් රජයේ නිලධාරියෙකු යනු කවරෙක්ද යන්න පැහැදිලි කිරීම අවශ්‍ය බවය. ඒ අනුව රජයේ නිලධාරියෙකු යනු විධායකයේ කොටසක් බවත්, නීති රීති රෙගුලාසි මග පෙන්වීම් රජයේ නිලධාරීන් විසින් අනුගමනය කල යුතු බවත්, නිරීක්ෂණය වූ ප්‍රධානම කරුණ වන්නේ සාකච්ඡා කල කරුණුවලින් 90% ක් පමණ නිලධාරීන් එම නීති රීති රෙගුලාසි මග පෙන්වීම් අනුගමනය කර නොතිබීම මත පැන නැගී ඇති බව යන්න ඔහු විසින් ප්‍රකාශ කරන ලද අතර, එබැවින් ඒ සඳහා එම නිලධාරීන් වගකිව යුතු බවද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව නිලධාරීන් වෙතින් අයකල යුතු බවට නිර්දේශ කිරීම මානසික පීඩනයක් වන බවද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. එබැවින් සැළකිල්ලෙන් රාජකාරි සිදු කරන ලෙසත්, අයකර ගැනීම් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කර ඉක්මනින් විසඳා ගන්නා ලෙසත්, එසේ නොකල හොත් එසේ කටයුතු නොකිරීම මත ක්‍රියාමාර්ග ගත යුතු අය වගකීමට බැඳෙන බව ද ප්‍රකාශ කරන ලදී. සෑම කාර්යාලයකම සියළුම වැඩවලට නිවැරදි ක්‍රමවේදයන් අළුතින් ලියා අනුමත කර ගන්නා ලෙසත්, ඒ අනුව කටයුතු කරන ලෙසත් එහිදී අනුගමනය කරන ලිපි ගොනු ලේඛන මොනවාද යන්නත්, මග පෙන්වන නීති රීති මොනවාද යන්නත් සටහන් කර තිබිය යුතු බවත්, පෙන්වා දෙන ලදී. ඒ අනුව පරීක්ෂණවලදී වගකිව යුතු කවුරුන්ද යන්න හඳුනාගත හැකි බව ද ප්‍රකාශ කරමින් සියළුම ආයතවලට ක්‍රමවේද සකස් කිරීමට ලිඛිත නියෝගයක් ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම්තුමන් වෙතින් ඉල්ලා සිටින ලදී. මෙම රැස්වීමේදී සාකච්ඡා කරන්නේ පැරණි කරුණු බවත්, වර්තමාන තත්වය ද නිවැරදිව ඇති බවට විශ්වාස කල නොහැකි බවත් ප්‍රකාශ කරමින් පෙන්වා දුන් ක්‍රමවේද සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස නැවතත් ඉල්ලමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

05.2 ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කේ.එම්.එල්. ආරියරත්න මිය විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ ඒ ඒ අවස්ථාවේ අදහස් දැක්වීම් සිදුකල බවත්, විශේෂයෙන් කිව යුතු වන්නේ සියළුම කාර්යාල අභ්‍යන්තර පාලන ක්‍රම, මුදල් රෙගුලාසි, නීති රීති අනපනත් හා වරින් වර නිකුත් කරන චක්‍රලේඛ අනුගමනය කල යුතු බවත්, දැනට පළාත් අමාත්‍යාංශ වෙනස් කිරීම සිදු කර ඇති බැවින් කාර්ය මණ්ඩල

සම්බන්ධයෙන් අවධානය යොමුකල යුතු බවත්, විශේෂයෙන් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතන සංඛ්‍යාව වැඩි වී ඇති බැවින් එම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීමට අවධානය යොමු කල යුතු බවත් ප්‍රකාශ කරමින් සියළු දෙනා වෙත ස්තුතිය පල කර අදහස් දැක්වීම අවසන් කරන ලදී.

01.3 පළාත් භාණ්ඩාගාර නියෝජිත යූ.එස්. අරුණරවි මහතා විසින් ද අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ ඒ ඒ අවස්ථාවේ අදහස් දැක්වීම් සිදුකල බවත්, පසුගිය කාලයේ දින දෙකක් පැවති පළාත් මට්ටමේ විගණන හා කළමනාකරණ කමිටුව එක් දිනකදී අවසන් කල හැකි තත්වයට පැමිණ සිටීම සම්බන්ධයෙන් සතුටු විය හැකි බවත්, විශේෂයෙන් පරීක්ෂන කමිටු වාර්තා ප්‍රමාද වීම තවදුරටත් පවතින බැවින් ඒවා ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතු බවත්, රැස්වීමට පැමිණීමේදී සූදානම් සහිතව පැමිණෙන්නේ නම් තවදුරටත් කාලය අඩුකර ගත හැකි බව පෙන්වා දෙමින් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිතුමිය විසින් සඳහන් කල පරිදි කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගැනීම කෙරෙහි සාකච්ඡා කෙරෙමින් පවතින බවත් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

01.4 උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් ජේ.එම්.ආර්.පී.ජයසිංහ මහතා විසින් ප්‍රකාශ කරන ලද්දේ පළාත් භාණ්ඩාගාරයේ අරුණරවි මහතා විසින් ප්‍රකාශ කල පරිදි පසුගිය කාලයේ දින දෙකක් පැවති පළාත් මට්ටමේ විගණන හා කළමනාකරණ කමිටුව එක් දිනකදී අවසන් කල හැකි තත්වයට පැමිණ සිටීම සම්බන්ධයෙන් සතුටුවිය හැකි බවත්, සාකච්ඡා කරන ලද කරුණු අනුව අවබෝධ කර ගත හැක්කේ පසුගිය කාලයේ ඒ ඒ ආයතනවල අධීක්ෂණය කල යුතු කණ්ඩායම් නිවැරදිව කටයුතු කර නොතිබීම මත මෙවැනි දේ සිදු වී ඇති බවත්, දැනට සිටින කණ්ඩායම් එම අඩුපාඩු නිවැරදි කරන අතරතුරම වර්ථමානයේ තමන්ගෙන් විය යුතු අධීක්ෂණය නිසියාකාරයෙන් සිදු කල යුතු වන බවය. එසේම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් ප්‍රකාශ කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී නිවැරදි ක්‍රමවේද පෙලගස්වා ඉදිරියේදී මෙවැනි දේ සිදු නොවීමටත් කටයුතු කරන ලෙසත් දන්වන ලදී. තවද ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති මෙන්ම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමා ප්‍රකාශ කල කරුණු අවධානයට ගන්නා ලෙසත් දන්වමින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත විශේෂ ස්තුතිය පල කරමින්, ජාතික විගණන කාර්යාලයේ නිලධාරී මහත්ම මහත්මීන්, පළාත් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් හා ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත ද ස්තුතිය පල කරන ලද අතර, විශේෂයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටියදී ද ඇය විසින් විගණන සැළැස්මට බැහැරින් ලැබෙන පෙත්සම් හා විශේෂ පරීක්ෂණ ද සිදුකරන බවත්, ඇය විසින් ප්‍රකාශ කල පරිදි අභ්‍යන්තර විගණන වාර්තා මගින් පෙන්වා දෙන අභ්‍යන්තර පාලන අඩුපාඩු නිවැරදි කර නොගැනීමෙන් නැවත නැවතත් එම කරුණුම පරීක්ෂා කිරීමට සිදුවීම මෙම පළාතේ ඇති අඩුපාඩුවක් බව පිළිගත යුතු බවත්, එය නිවැරදි කර ගැනීමට අවධානය යොමු කල යුතු බවත් ප්‍රකාශ කරමින් සියළු දෙනා වෙත ස්තුති වන බව ද නැවතත් ප්‍රකාශ කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

02. රැස්වීම අවසන් කල වේලාව - ප.ව.16.30

**(බී.වී.කේ.බී.බෙනරගම)**
ප්‍රධාන අභ්‍යන්තර විගණක.
උතුරුමැද පළාත.